# රණවිරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

25 වන කලාපය 2017 - ජුලි, ඔක්තෝබර්

## දැනුම දිනුමට අත්වැලක් වී ...



ස්වේච්ඡා බළසේනා සාමාජික සාමාජිකාවන්ගේ දූ පුතුන් හට සිය අධ්‍යාපන කටයුතු සාර්ථක කරලීම සඳහා සවියක් වෙමින් අධ්‍යාපන අවශ්‍යතා හිමිගැන්වීමේ මාහැඟි සත්කාරයක් ඉකුත් නොවැම්බර් 20 දින ස්වේච්ඡා බළසේනා සේනාවිධායකගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

එහිදී උපතින්ම ආබාධ සහිතව සිටියද කැපවීමෙන් ඉගෙනුම ලැබ, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පීඨයට ඇතුලත් වීමට වරම් හිමිකර ගත් දිරිය දියණියක වූ 2 වන වෛද්‍ය බළකායට අයත් කෝප්‍රල් රණවීර සී ගේ දියණිය වන චතුරානි ශ්‍යාමලී රණවීර වෙත සේනාවිධායක ගේ කාරුණික මැදිහත් වීමෙන් අධ්‍යාපන උපකරණ වලට අමතරව විශේෂ මුදල් ප්‍රදානයක්ද සිදුකරන ලදී.

( වැඩි විස්තර 10 වන පිටුවට ... )





# ගෞරවනීය තනතුරකට
# සුභ මොහොතින් එළැඹි වගයි

ස්වේච්ඡා බළසේනාවේ 27 වන නියෝජ්‍ය සේනාවිධායක ලෙස බ්‍රිගේඩියර් එල්එෆ් කස්තුරිආරච්චි පසුගිය නොවැම්බර් 27 වන දිනට යෙදුණු සුබ මොහොතින් සිය තනතුරේ වැඩ භාර ගන්නා ලදී.

1986 පෙබරවාරි 14 දින යුද හමුදාවට එක්ව ඇති ඔහු 5 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට අනුයුක්තව සිය රාජකාරී අරඹන ලදී. එතැන් පටන් ඒකක මට්ටමේ සියලු තනතුරු දරා 1999 වසරේදී ඔහු 5 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලෙස පත්විය. ඉන් අනතුරුව යුද හමුදාවේ විවිධ තනතුරු රැසක් ඔහු විසින් හොබවා ඇත. ප්‍රධාන මාණ්ඩලික නිලධාරී I ශ්‍රීලංයුහසෙව්බමු, වැ:බ: කර්නල් ප්‍රමානි ශ්‍රීලංයුහසෙව්බමු, මාණ්ඩලික නිලධාරී I ශ්‍රීලංයුහසෙව්බමු නිලධාරී ශාඛාව, කොළොන්නාව තෙල් ටැංකි සංකීර්ණයේ ආරක්ෂාව භාර නිලධාරී, සිවිල් සම්බන්ධීකරණ නිලධාරී 551 බසේමු හා 51 සේමු, සහයක කර්නල් සම්බන්ධීකරණ නිළධාරී ආසේමු (යාපනය), කර්නල් සම්බන්ධීකරණ නිලධාරී 54, 64 සේමු, ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධීකරණ නිලධාරි ආසේමු (වන්නි), අධ්‍යක්ෂක සෙනෙහස විශේෂ අධ්‍යාපන කේන්ද්‍රය, පුහුණු පරීක්ෂක ශ්‍රීලංයුහසෙව්බමු ආදී තනතුරු වේ.

වසර 31 ක සිය සේවා කාළය තුළ උතුරු නැගෙනහිර ඇතුලු දිවයිනේ විවිධ ප්‍රදේශ වල රාජකාරීන්හි නියැලි මෙම ජ්‍යේෂ්ඨ නිලධාරී පසුගිය යුධමය කාලසීමාවේදී ක්‍රියාන්විත සේවාවන් වෙනුවෙන් ලබාදුන් දායකත්වය සුවිශේෂී වේ. විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලත් උපාධිධාරියෙකුද වන ඔහු සිය වෘත්තියෙන් පරිභාහිරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්ද හදාරා ඇති පාඨමාලාද රැසකි.

- කළමණාකරණ අධ්‍යයන විශේෂ උපාධිය - විවෘත විශ්ව විද්‍යාලය
- ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව) පශ්චාත් උපාධිය - කැලණිය විශ්ව විද්‍යාලය
- සංවර්ධන ආර්ථික විද්‍යාව ශාස්ත්‍රපති පශ්චාත් උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය
- කළමණාකරණ ඩිප්ලෝමාව - විවෘත විශ්ව විද්‍යාලය
- මානව සම්පත් කළමනාකරණ ජාතික ඩිප්ලෝමාව - ජාතික ව්‍යාපාර කළමණාකරණ ආයතනය
- කාර්යාල කළමණාකරණය - ජාතික ව්‍යවසායකත්ව කළමණාකරණ ආයතනය
- වෘත්තීය අලෙවිකරණ පාඨමාලාව - ජාතික අලෙවිකරණ ආයතනය
- පුස්තකාල හා ප්‍රලේඛන පාඨමාලාව - කැලණිය විශ්ව විද්‍යාලය
- ඉංග්‍රීසි භාෂා පාඨමාලාව - මානව සම්පත් කළමණාකරණ ආයතනය කොළඹ විශ්ව විද්‍යාලය

ඉතිරිය 16 පිටුවට







# රණවරුණ


**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථානය

**උපදේශක මණ්ඩලය**

බ්‍රිගේඩියර් එල්එෆ් කස්තුරිආරච්චි
කර්නල් එම්පීඑන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

**සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ

**‘රණවරුණ” කාර්ය මණ්ඩලය**

ලුතිතන් එච්පීඑම්පීබීඑම් පළිහක්කාර ශ්‍රීලංජාආබමු
ලා/කෝප්‍රල් සුජීව කුමාර කෝවිලතැන්න (සැකසුම් සහය)
බනි II සුසිරිපාල ඩබ්ලිව්එම්
කෝප්‍රල් නන්දසිරි බීජීඑල්
ලා/කෝප්‍රල් සාලිය බණ්ඩාර යූඕඑ
ලා/කෝප්‍රල් චාමර එම්කේආර්එල්
ලා/කෝප්‍රල් කීර්තිරත්න එඑම්ටීඑස්
සාසෙ බෝතේජු පීඩබ්ලිඩබ්ලිව්

**රණවරුණ ලිපිනය**

සංස්කාරක
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථානය
යුද හමුදා කඳවුර
සාලාව - කොස්ගම

ඊමේල් ranawaruna@yahoo.com
දුරකතන - 036 2255 362
ෆැක්ස් - 036 2255 709

**පරිගණක නිර්මාණය හා මුද්‍රණය**

නියෝ ග්‍රැෆික්ස්
0112 820 220


## මෙම මහඟු අවස්ථාව මගහැර නොයමු

විවිධ හේතූන් මත මේ වනවිට යුද හමුදාව හැරගොස් ඇති පිරිස දහස් ගණනකි. මෙම පිරිස් අතර, පුහුණු කාලසීමාවේදීම පැන ගිය හා මාස කිහිපයක කෙටි සේවා කාලයක් ගෙවූ අය මෙන්ම සැළකිය යුතු සේවා කාලයක් සම්පූර්ණ කළ අයද වෙති. එසේම ඇතමෙක් හමුදාව හැරගොස් ඇත්තේ මීට වසර ගණනාවකටත් පෙරදිය.

ඉහත කුමන තත්ත්වයක් යටතේ වූව එසේ හමුදාව හැරගිය ඇතැම් පුද්ගලයින් විසින් සිදුකරණ නොයෙකුත් නීති විරෝධි ක්‍රියා හේතුවෙන් පසුගිය කාළසීමාව මුළුල්ලේම යුද හමුදාවට එල්ල වූ අපකීර්තිය සුළුපටු නොවේ. මෙම තත්ත්වය සැළකිල්ලට ගනිමින් අදාළ පුද්ගලයින් නීතයානුකූල ලෙස යුද හමුදාවෙන් ඉවත් කිරීමේ වැඩසටහනක් පසුගිය දා ක්‍රියාත්මක කෙරුණි.

හමුදාව හැරගිය අයවළුන්ට වසර ගණන් ගත වූවද මෙතෙක් සමාජයේ ජීවත්වීමට සිදුවුයේ අප්‍රසිද්ධවය. විශේෂයෙන්ම ඔවුනට රැකියාවක් ලබාගැනීමේ දී, වෙනත් සමාජමය කටයුතු වලදී අත්විඳින්නට වූ ප්‍රායෝගික ගැටලු රැසකි. එබැවින් මෙම වැඩසටහන හරහා මෙවැනි පුද්ගලයින්ට ඉහත තත්ත්වයෙන් මිදීම සඳහා ඉතා අගනා අවස්ථාවක් උදාවී ඇත.

එසේම මේ අයුරින් නීතයානුකූල ලෙස හමුදාව හැරයන අයවළුන් මින් පසුව සිදුකරන කිසිදු නීතිවිරෝධි කටයුත්තක් වෙනුවෙන් යුද හමුදාව වෙත ඇඟිල්ල දිගු කිරීමට අයිතියක් නොමැත. තවද සමාජය වෙතින් මෙතෙක් කලක් ඔවුනට එල්ල වූ “හමුදාවෙන් පැන ආ අයෙකු” යන නාමයද මෙමඟින් අහෝසි වනු ඇත. සැබවින්ම මෙම වැඩසටහන හරහා සිදුකරනුයේ මෙතෙක් නීතයානුකූල නොවූ පුද්ගලයින් නීතියානුකූල කර සමාජගත කිරීමකි. එබැවින් මෙම අනඟි අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට එසේ හමුදාව හැරගොස් සිටින ඔබ දන්නා හිතවතුන් ඥාතීන් වේ නම් ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කරන්න

# දශක තුනක මෙහෙවරකින් පසු
# ඉසිඹු ලැබ

පුරා වසර එකහමාරකට ආසන්න කාලයක් ස්වේච්ඡා බළසේනාවේ වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක ධුරය හෙබවූ බ්‍රිගේඩියර් ඩබ්ලිව්එච්ඩී මහානාද ජ්‍යෙෂ්ට නිලධාරි පසුගියදා සිය තනතුරෙන්ද යුද හමුදා සේවයෙන්ද සමුගන්නා ලදි. ඒ දශක තුනකට එහා ගිය ගෞරවනීය මෙහෙවරක් නිමා කරමිනි. නියෝජ්‍ය සේනාවිධායක තුමන්ගේ නික්ම යෑම නිමිත්තෙන් එතුමන්ට හරසර දැක්වීම සඳහා විශේෂ උත්සවයක් ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් එම්එච්එස්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් මත සංවිධානකොට තිබුණි. මෙම පිටුව වෙන්වන්නේ එකී උත්සවයේ විශේෂ අවස්ථාවන්ගෙනි.

ඉසිඹු ලැබ යන නියෝජ්‍ය සේනාවිධායක තුමණි ඔබට චිරං ජයතු.





ඡායාරූප : ලා/කෝප්‍රල් සාලිය බණ්ඩාර ඕයූඒ

# 68 වසරක අභිමානය සමරා

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පිහිටුවා ඉකුත් ඔක්තෝම්බර් මස 10 දිනට වසර 68ක් සපිරුණි. ඒ නිමිත්තෙන් යුද හමුදා මූලස්ථානයේ පැවැති ප්‍රධාන සැමරුම් උත්සවයට සමගාමීව ස්වේච්ඡා බළසේනාව විසින්ද සමරු˚වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. ස්වේච්ඡා බළසේනාවේ මූලික මාණ්ඩලික නිලධාරි බ්‍රිගේඩියර් කේඩබ්ලිව්ආර් ද ආබ්‍රෙව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ ප්‍රධානත්වයෙන් මෙම සැමරුම් උත්සවය පැවැත්විණ.

මෙහිදි විශේෂයෙන් ප්‍රජාසත්කාරකායන්ට මුල් තැනක් දෙමින් සාලාව රජයේ රෝහල පිරිසිදු කිරිමේ ශ්‍රමදානයක් ද පැවත්විණි.



# ශ්‍රීලංජාආබමු

## ඉතිහාස පොතට නව පිටුවක්...







යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී පසුගියදා කුරුණෑගල ස්ථාපිත ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින් ඓතිහාසික මතකයන් රැසක් එම රෙජිමේන්තු ඉතිහාස පොතට එක්කරන ලදී. එහිදි වත්මන් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ මැදිහත්වීමෙන් මෑතකාලීනව සපුරාගත්, භෞතික සම්පත් රැසක් එදින යුද්ධ හමුදාධිපති අතින් රණවිරු අයිතියට පවරා දීම මෙම සංචාරයේ සුවිශේෂත්වය විය. දශක දෙකකට එහා ගිය එම රෙජිමේන්තු ඉතිහාසය තුළ මහත් අඩුවක්ව පැවති සරඹ භූමියක්, නවීන පහසුකම් සපිරි ශ්‍රවණාගාරයක්, පරිගණක විද්‍යාගාරයක්, පුස්තකාලයක්, නිලධාරි නේවාසිකාගාර ගොඩනැගිල්ලක් හා රෙජිමේන්තු සේවා වනිතා කාර්යාලයක් ද මෙම සංචාරයට සමගාමීව එදින යුද හමුදාපතිතුමන් විසින් විවෘත කරන ලදී.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි රුවිනි සුජීවා වික්‍රමරත්න මැතිණියගේ මෙහෙයවීමෙන් සංවිධානය කෙරුණු රෝහල් උපකරණ පරිත්‍යාග කිරීමේ මහගු කටයුත්තක් ද එදින සිදුකෙරුණු අතර, එහිදි යුද හමුදා සේවා වනිතා ඒකකය වෙත රෝද පුටු 34ක් හා රු200000.00 මුදලක් ද, මහනුවර, හලාවත රජයේ රෝහල්වල නේවාසිකව ප්‍රතිකාර ලබන පිළිකා රෝගීන් ගේ ප්‍රයෝජනයට විශේෂ පහසුකම් සහිත ඇඳන් 17ක් ද පරිත්‍යාග කරන ලදී. තවද උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂක විසින් පරිත්‍යාග කරන ලද ශ්‍රවණාධාර උපකරණ තුනක් සේවයේ නියුතු සෙබළුන්ගේ ශ්‍රවණ ආබාධිත දරුවන් තිදෙනෙකු වෙත පරිත්‍යාග කිරීම ද මෙම උත්සවයට සමගාමීව සිදුකරන ලද අතර, මෙම අවස්ථාවට හිටපු රෙජිමේන්තු අධිපතිවරු හා යුද හමුදාවේ ජ්‍යෙෂ්ට නිලධාරිහු රැසක් ද, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනී චන්ද්‍රිකා සේනානායක මැතිණිය ඇතුළු සම්භාවනීය අමුත්තෝ රැසක් ද එක්වූහ.

# අණදෙන නිලධාරි වැඩමුළුවක්

දියතලාවේ පිහිටි යුද හමුදා ස්වේච්ඡා පුහුණු පාසල විසින් සංවිධානය කරන ලද ඒකක අණදෙන නිලධාරි වැඩමුළුවක් පසුගියදා දියතලාව ස්වේච්ඡා පුහුණු පාසලේ දී පැවැත් වුණි. මෙම වැඩමුළුව සඳහා ස්වේච්ඡා බළසේනාවට අයත් ඒකකයන්හි අණදෙන නිලධාරිවරු 40 දෙනෙකු සහභාගී වූහ. සම්පත් දායකත්වය විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා ඒ ඒ ක්ෂේත්‍ර නියෝජනය කරන ප්‍රවීණ දේශක මඩුල්ලක් විසින් සපයන ලදී. මානව සම්පත් කළමණාකරණය හා නායකත්වය, සිවිල් නීතිය, මූල්‍ය කළමණාකරණය හා භෝජනාගාර ගිණුම් පිළිවෙත යන විෂය ක්ෂේත්‍රයන් මෙමගින් අවාරණය කළ අතර, 2017.09.15 වන දින සිට 2017.09.19 වන දින දක්වා අදාළ වැඩමුළුව පවත්වන ලදී.



ලුතිතන් කර්නල් චන්න කරුණාරත්න ආර්එස්පී (විශ්‍රාමික) එම වැඩමුලුව මෙහයවමින්...



# සුභ මොහොතින් නව තනතුරු ලැබ



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථාන
මූලික මාණ්ඩලික නිලධාරි
**බ්‍රිගේඩියර් කේඩබ්ලිව්ආර් ද ආබ්‍රෙව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා
බළසේනා මුලස්ථාන
**බ්‍රිගේඩියර් පාලන කර්නල් ටීටීපී සිල්වා**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථාන යුධසේවා
ලේකම්
**කර්නල් ඩීසීවිකේ කුලතුංග යූඑස්පී**



ආරක්ෂක සේනා මුලස්ථානය (නැ) ප්‍රධාන
සිවිල් සම්බන්ධීකරන නිලධාරි
**ලුතිතන් කර්නල් ආර්ඒටී රණසිංහ ආර්එස්පී විපාරෙ**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථාන
සේනාවිධායක ලේකම් කාර්යාලය මානි I
**ලුතිතන් කර්නල්**
**එම්ඒඑම්ටී සෙනෙවිරත්න විපාරෙ**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා
මුලස්ථානයේ
**කර්නල් භකාස**
**ලුතිතන් කර්නල් ඒඑච් ලියනගේ ශ්‍රීලසසබ**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථාන
නිලධාරි ශාඛාව මානි I (පොදු)
**ලුතිතන් කර්නල්**
**ජේඒජේ ජයරත්න ශ්‍රීලංසිරෙ**



6 (සෙව්) සන්නදධ බුද්ධි බළකා
රෙජිමේන්තු අණදෙන නිලධාරි
**ලුතිතන් කර්නල් ඒඑම්එන්පි අත්තනායක - සබුබ**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථාන
මානි I සුභ සාධක
**ලුතිතන් කර්නල් ඩබ්කේඑස් ප්‍රියන්ත ලාල් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලංසිරෙ**



7(සෙව්) ගජබා රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් එස්ඒකේඩී ලේකම්ආරච්චි ආර්එස්පී ගරෙ**

# සුභ මොහොතින් නව තනතුරු ලැබ



6 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළු
වැ.බ. අණදෙන නිලධාරී
**මේජර් එස්බී ඒකනායක ශ්‍රීලංජාආබමු**



22 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් එච්එම්එල්බී සමරකෝන් ශ්‍රීලංජාආබමු**



2 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් එඑටීඩබ්පි අබේසේකර ශ්‍රීලංසිරෙ**



3(සෙව්) විජයබාහු පාබල
රෙජිමේන්තු වැ:බ: අණදෙන නිලධාරී
**මේජර් ඩබ්ලිව්ආර් ධර්මසේන විපාරෙ**



1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක
බලමුළු වැ.බ. අණදෙන නිලධාරී
**මේජර් පීඑම්පී කොස්තා ශ්‍රීලංජාආබමු**



2(සෙව්) ගැමුණු හේවා බළඇණියේ
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් ඊආර්ටීඒ සමරකෝන් ගැහේබ**



11 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් ආර්ඩීසී මුණසිංහ ශ්‍රීලංජාආබමු**



3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් ඩබ්ලිව්ඒඑම් රණතිලක ශ්‍රීලංසිරෙ**



5(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් ආර්ආර්එස් දෙහිගල ශ්‍රීලංසිරෙ**



25 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් ඩබ්ලිව්ඒඑල්ඒ කුමාර ශ්‍රීලංජාආබමු**

# දැනුම දිනුමට
# අත්වැලක් වී...















ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන්ගේ දුවා දරුවන් හට සිය අධ්‍යාපන කටයුතු සාර්ථක කරලීම සඳහා සවියක් වෙමින් ඔවුන් වෙත අධ්‍යාපන අවශ්‍යතා හිමිගැන්වීමේ මහඟු සත්කාරයක් ඉකුත් නොවැම්බර් 20 දින ස්වේච්ඡා බලසේනා මූලස්ථාන පරිශ්‍රයේදී සිදුකෙරිණ. ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් එම්එච්එස් බොනිෆස් පෙරේරා ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යූඑස්පි එන්ඩීයු පිඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම කටයුත්තට විශ්ව විද්‍යාල ප්‍රවේශය ලත් දරු දැරියෝ ඔවුන්ගේ දෙමාපියෝ මෙන්ම ස්වේච්ඡා බලසේනාවට අයත් ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ නිලධාරීහු හා සෙසු නිල විශාල පිරිසක් සහභාගී වූහ.

මීට ඉහත වසරවලදීද ස්වේච්ඡා බලසේනාවේ සංවිධායකත්වයෙන් මෙවැනි අධ්‍යාපනික සත්කාරක වැඩසටහන් ක්‍රියාත්මක කළද එමගින් ප්‍රතිලාභ හිමිවූයේ තෝරාගත් ශිෂ්‍ය කාණ්ඩ සඳහා පමණි. නමුත් මෙවර වත්මන් සේනාවිධායක තුමන්ගේ නව සංකල්පයක් ක්‍රියාවට නගමින් ස්වේච්ඡා සාමාජික සාමාජිකාවන් ගේ අධ්‍යාපනය ලබන සියලුම දරු දැරියන් වෙත අදාළ අධ්‍යාපන අවශ්‍යතා ලබාදීම සිදුකෙරිණ. එසේ හිමිගැන්වූ අධ්‍යාපන අවශ්‍යතා අතර, අභ්‍යාස පොත්, ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂ හා පරිගණක ටැබ් ආදිය විය. ස්වේච්ඡා බළසේනා මූලස්ථානය නිරන්තරව මෙවැනි කටයුතු සංවිධානය කරනුයේ එහි සාමාජික සාමාජිකාවන් ගේ දූ පුතුන් රටට දැයට වැඩදායි යහපත් පුරවැසියන් වනු දැකීමේ අරමුණ පෙරදැරිවය. ස්වේච්ඡා බළසේනා මූලස්ථාන සුභසාධක අංශය මෙම කටයුත්තට සම්බන්ධීකරණ දායකත්වය සපයන ලදි.

# කවි මල් යාය

## සඳ

නොසිතූ නිමේෂයක පායාවිත්
මසිත් අඳුරු අහස් ගැබ
එකළු කරන්නට
වෙරදැරූ සඳකි නුඹ
නොකියාම විත් පායා
නොකියාම බැසගිය
සඳකි නුඹ
පෙරදිනෙක
මාගේ ගණඳුරු ලොවට
පතන්නම් මතු දිනෙක
යලිත් පායා එන්නට
ගණඳුර නැසීමට

**සෙ/එච්101058**
**සාසෙ වීරසිංහ එච්කේටීසී**
16 (සෙව්) විජයබාහු පාබල
රෙජිමේන්තුව

## මට වැටහුනා සත්තයි....

නුඹේ කඳුළ,
මම හිටියා සත්තයි...
ඒ කඳුළ, දැක
නුඹේ කඳුළටත් එහා
ඈත ගිය දුකක්
මේ හදවතට දැනුනා
සත්තයි...

නුඹේ සිනහව ලඟ
මම සිටියා සත්තයි...
ඒ සිනහව දැක
මා කෙදිනකවත් නොලැබූ
සතුටක් ලැබුවා සත්තයි....

එනමුදු නුඹ
මගේ කඳුල දැක
සිනාසුනා නොවේද..?
මගේ සතුට දැක
ඊරිසියා කලා නොවේද..?
ඒ බවත් මට වැටහුනා
සත්තයි...

සෙ/කියු104364
**සාසෙ බංඩාර කේඑම්ඒඑච්**
23 ශ්‍රීලංජාආබමු

## අම්මා

වැටෙන වැටෙන හැම මොහොතෙම මා නැගිටුව අම්මා
ඇසට හොරෙන් කඳුළු ලොවට හැංගු මගේ අම්මා
දිවි කතරට ඇද හැලෙනා මහ වැස්සකි අම්මා
ලොවේ සැමට උඩින් ඉන්න රැජිණ තමයි අම්මා

**සෙ/එච්101241**
**සාසෙ ධර්මසිරි කේපීබීඑල්**
**16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව**

## මා හැරගිය මගේ පෙම්වතියේ

විල ලස්සනයි විල මැද සුදු මල් පිපුණොත්
මල් ලස්සනයි හැමදාමත් පර නොවුනොත්
කඳු ලස්සනයි හිම කැට සැමදා තිබුනොත්
සිත දුක්බරයි ආදරයක් අහිමි වුනොත්

එන්නට බැරිවුනා මට නුඹ බලන්නට
දෙන්නට දෙයක් නොතිබුණි දුප්පත් කමට
දුන්නේ හදවතයි පිරිසිදු නුඹ නමට
එය රැක නොගත්තේ ඇයිදැයි කියනු මට

එක්වන්නට සිතා දහසක් පැතුම් මවා
පස් වසරක් දිගටම ආදරය කළා
නොසිතූ නොපැතූ විටකදි වෙන හිතක් බලා
ඉගිලුනි කිමද වෙන හදකට සතුට පතා

නැගණියකට වගේ ආලය කළ හින්දා
මායාවක් වගේ නුඹ මගෙ සිත බින්දා
ඡායාවක් මගේ නුඹ හද තුළ රන්දා
මිරිගුවකට මා මේ ලෙස පෙම් බැන්දා

සෙ/15කියු01548
**ලා/කෝ අබේසිංහ ජීඑම්එන්කේ**
15 ශ්‍රීලංජාආබමු



### සතුට සහ සාර්ථකත්වය සඳහා
## ජීවිත කළමනාකරණ උපාය මාර්ග

පසුගිය කලාපය හා බැඳේ...



# සූදානමින් සිටින්න! ජීවිතය අනපේක්ෂිතව යහපත් අවස්ථා උදාකරයි!

මේ ලෝකය තුල ප්‍රාතිහාර්ය සිදුවිය හැකිය. කිසිවක් නොමැතිව සුබවාදී බලාපොරොත්තුවෙන් පමණක් ආරම්භ කරන්න. මේ මිහිපිට යථාර්ථයන් බවට පත්ව ඇති ඕනෑම විස්මිත නිර්මාණයකම මූලික බීජය හට ගත්තේ මිනිස් මනසක් තුළය. එවිට අපට අවශ්‍ය අවස්ථා උදාවේ. මග විවරවේ. එබැවින් ප්‍රථමයෙන්ම බලාපොරොත්තුව දල්වන්න. ඔබට සැබෑවක් බවට පත්කර ගැනීමට තිබෙනසිහිනය සැබෑකර ගැනීම සඳහා ධෛර්‍යමත් වන්න. එය සැබෑවන තෙක්ම බලාපොරොත්තු සහගතව ධෛර්‍යය පවත්වා ගන්න.

ප්‍රාතිහාර්ය යනු සොබා දහමට අනුව විය නොහැක්කක් නොව සොබා දහමටම අයත් අපට ග්‍රහණය නොවූ එහිම දිගුවකි. එහෙත් බොහෝ අය ඇබ්බැහි කමින්ම ජීවිතය දකින්න පරුදු වෙලා ඉන්නෙ අශුභවාදීව යි. එහි ප්‍රතිඵලය ලෙස අප ප්‍රාතිහාර්ය ලෙස හඳුන්වන අතිශයින්ම ශුභවාදී සිදුවීම්, සිදුවිය නොහැකි ඒවා ලෙස සැලකීමට තරම් අශුභවාදී වී සිටිනවා. මෙයින් සිදුවන්නේ ජීවිතයට ලැබෙන අනගි ප්‍රස්තාවන් අහිමි වීයි.

ප්‍රාතිහාර්යයන් සිදුවන්නේත්, සිදුවියයුත්තේත් අතිශයින්ම දුෂ්කර සහ කිසිදු ලෙසකින් යහපත් බලාපොරොත්තුවක් තබා ගත නොහැකි අවස්ථාවලදීය. එබැවින් ජීවිතයේ එවැනි අතිශයින්ම දුෂ්කර සහ සියලු බලාපොරොත්තු බිඳ වැටී ඇති අවස්ථාවලදී තව දුරටත් බලාපොරොත්තු දල්වාගෙන සිටින්න. එවිට ප්‍රාතිහාර්යයන් සිදුවේ. පහතින් දක්වා ඇත්තේ එවැනි ප්‍රාතිහාර්යක් සිදුවූ සත්‍ය කතාවෙකි.

**දැරියකගේ ඩොලර් එකකුත් ශත එකොලහේ ප්‍රාතිහාර්යය.**

ඇගේ නම ටෙස්. වයස අවුරුදු අටයි. ජීවත් වුණේ ඇමරිකා එක්සත් ජනපදයේ. ටෙස්ට වයස අවුරුදු හතරක මල්ලි කෙනෙක් හිටියා ඇන්ඩෲකියල. ඇන්ඩෲගේ හිස් කබල ඇතුලෙ කිසියම් බරපතල රෝගී තත්වයක් තිබුණා. ඉතින් දවසක් වෛද්‍යවරු හමුවෙලා ගෙදර ආපු ටෙස්ගෙ තාත්තා අම්මත් එක්ක රහසෙන් කිව්වා ඇනඩෲගේ ජීවිතය බේර ගන්න පුළුවන් වෙන්නෙ ප්‍රාතිහාර්යකට විතරයි කියල. මේක ටෙස්ට අහම්බෙන් ඇහුණා. ටෙස් මල්ලීට ගොඩක් ආදරෙයි.

ඒත් ඇය දැනගෙන හිටියෙ නැහැ ප්‍රාතිහාර්යක් කියන්නෙ මොකක්ද කියල.

ටෙස් හිතුවෙ ප්‍රාතිහාර්යක් කියන්නෙ කිසියම් බෙහෙතක් වෙන්න ඇති කියල. ඉතින් එයා හොරෙන් ම එයාගෙ කාමරයට ගිහින් තමන් කාලයක් තිස්සෙ ජෑම් බෝතලයක එකතු කරගෙන තිබුණ කාසි ටික මේසෙ උඩට හලලා ගණන් කලා. එතන තිබුණේ ඩොලර් එකකුත් ශත එකොලහයි. ටෙස් ඒ කාසි ටික මිට මොලවාගෙන කාටත් හොරෙන්ම ගෙදර පිටිපස දෙරන් පිටත් වුණේ ගෙවල් අසල පිහිටි ෆාමසියකට යන්නයි.

ටෙස් ෆාමසියට යනකොට ෆාමසිකරු හොඳින් ඇඳ පැළඳ ගෙන හිටපු තවත් කෙනෙක් සමග කතා කරමිනුයි හිටියෙ. ඉතින් ෆාමසි කරු ටෙස්ව වැඩි ගණනකට ගත්තේ නැහැ. ඒත් ටෙස් නිකම්ම ආපසු හැරෙන්න නෙවෙයි ආවෙ. ඇය හිත තද කරගෙන ෆාමසි කරුගෙන් ප්‍රාතිහාර්ය කියන බෙහෙත තිබෙනවා දැයි ඇසුවා.

ඉතින් ෆාමසිකරු පුදුමයෙන් වගේ ඇසුවා මොකක්ද ළමයා, ප්‍රාතිහාර්යක්? කියලා. ටෙස් පිළිතුරු දුන්නා "මගේ මල්ලීගේ නම ඇන්ඩෘ. එයාගෙ ඔළුව ඇතුලෙ අමාරු ලෙඩක්. තාත්තා කියනවා ඒක සනීප කරන්න පුළුවන් වෙන්නෙ ප්‍රාතිහාර්යකට විතරයි. ඒත් තාත්තා ළඟ ඒකට වියදම් කරන්න සල්ලිත් නැහැ. අනේ මේ සල්ලි ටික අරන් මට ඒ බෙහෙත දෙන්න" කියල. ෆාමසිකරු ගනනකට නොගෙන හිනාවෙලා කියනවා " ළමයා අපි මෙහේ ප්‍රාතිහාර්ය විකුණන්නේ නැහැනේ " කියල.

ඒත් ෆාමසිකරු සමග හිටිය හොඳින් ඇඳ පැළඳ ගත් අනික් කෙනා ටෙස්ගේ අතේ තිබුණ කාසි ටික ඉල්ලාගෙන ඇගේ අතින් අල්ලාගෙන ඔහුව ඇගේ දෙමාපියන් මුණගැසීමට රැගෙන යන ලෙස ඉල්ලා සිටියා. මේ පුද්ගලයා අන්කිසිවෙකුනොව කාල්ටන් ආම්ස්ට්‍රොංග් නමැති විශේෂඥ වෛද්‍යවරයායි. ඔහු මේ කුඩා දරුවාට අවශ්‍ය සියලු ප්‍රතිකාර නොමිලේ ලබාදී සුවපත් කළා.

මේ පුංචි කතාව අපට ඉතාමත්ම වැදගත් පාඩමක් කියා දෙනවා. ඒ තමා, සුබවාදී බලාපොරොත්තුවෙන් කටයුතු කරන අයට ජීවිතයේ ඕනෑම මොහොතක ප්‍රාතිහාර්ය සිදුවිය හැකි බවයි. වැඩිහිටි අප නිතරම හිතන්නේ හරියටම ටෙස්ගේ පියා වගේ හේතුවාදී අසුබවාදයට සීමා වෙලයි. ඒ කියන්නේ ජීවිතයේ කිසියම් අභියෝගාත්මක බැරෑරුම් අවස්ථාවලදී අප වැඩි දෙනෙක් සියලු බලාපොරොත්තු අත්හැර දමා විය හැකි නරකම දෙය බාර ගන්න සූදානම් වෙනවා. එහෙත් එවැනි අවස්ථාවලදී අප ක්‍රියා කලයුතු වන්නේ හරියටම ටෙස් ක්‍රියාත්මක වූ ආකාරයටයි.

ඒ කියන්නේ ප්‍රාතිහාර්යයක් සිදු වීමට ඇති ඉඩ කඩ විවරව තබමින් සුබවාදීව කටයුතු කිරීමයි. මේ ලෝකයේ ඕනෑම අසුබවාදී දෙයක් සේම සුබවාදී දේවල්ද සිදුවීමට ඉඩ කඩ තිබෙනවා. ප්‍රාතිහාර්යක් කියල කියන්නේ සොබා දහමට ප්‍රතිවිරුද්ධ කිසිවක් නොවෙයි. සොබා දහමේම අප නොදන්නා දිගුවක් පමණයි. එබැවින් ජීවිතයේ ඕනෑම අමිහිරි බරපතල සිදුවීමකදී, විය හැකි බරපතලම දෙය බාර ගැනීමට සූදානමින් බලාපොරොත්තු සහගතව ක්‍රියාත්මක වන්න.

ජීවිතය සැබැවින්ම අතිශයින් සුන්දර වූ අත්දැකීමකි. එහෙත් එහි සුන්දරත්වය විඳ ගැනීමට හැකි වන්නේ ඒ සඳහා සූදානමින් සිටින සුබවාදීන්ට පමණි. ඇතැම්විට ජීවිතයේ අතිශයින්ම සුන්දර අවස්ථාවන් එක් වරම උදාවී, නැතිවී යයි. ඉන්පසු කිසි දිනෙක එම සුන්දර අවස්ථාව නැවත නොඑළඹෙන්නට පවා ඉඩ තිබේ. ජීවිත්වීමේදී අනවශ්‍ය තරම් හේතුවාදී නොවන්න. ජීවිත් වීමේදී මුහුන දීමට සිදුවන සියලු අත්දැකීම් හේතුවාදී තර්ක මගින් පැහැදිලි කිරීමට නොහැකිය.



**හැම විටම යහපත් යමක් සිදුවන බවට විශ්වාසයෙන් පසුවන්න. ප්‍රාතිහාර්යයන් අපේක්ෂාවෙන්, බලාපොරොත්තු දල්වාගෙන සිටින්න. අසීමාන්තික ලෙස හේතුවාදී නොවන්න. අවම වශයෙන්, අශුභවාදී නොවී සිටීම මගින්, ශුභවාදී යමක් සිදුවීමට ඇති ඉඩ කඩ විවරව තබන්න.**

ඉදිරි කලාපය හා සම්බන්ධයි

ලුතිතන් කර්නල් චන්න කරුණාරත්න රශුප
(විශ්‍රාමික) ජීවිත මාර්ගෝපදේශන උපදේශක

ගේය පදරුත් විමසුම



# පැන මඩ කඩිති

පැන මඩ කඩති වැව් තාවල වැහි කාලේ
පෙන්නා මග නොමඟ නොවැටී යන තාලේ
සිප්කිරි පෙවු මූසිලයින් උඩුමාලේ
අපෙ ගුරුතුමා යයි තාමත් ඉස්කෝලේ

සාමා අමර විකුණති බස් පොලේ කජු
කුමාරෝද පිටු දන්දෙති එයින් මතු
උගතමනා ශිල්පය පිල්කඩ නොපැතූ
වේවැල වටා ඉකිබිඳ දඩුවමක් පැතූ

රන්මසු පටපිලී අබරන උරන වෙලා
සමන් පිච්ච කැකුලිය ගෙයි මිලින වෙලා
ගුරු නිවහනේ කඳුලට උල්පතක් වෙලා
ලොකු හාමිනේ ඇත බිතු සිතුවමක් වෙලා

ගායනය: සුනිල් එදිරිසිංහ
පද: මහින්ද චන්ද්‍රසේකර
සත්සර: රෝහණ වීරසිංහ

ගුරු යන්නෙහි අර්ථ රැසකි. ගුරු යනු නවග්‍රහ මණ්ඩලයෙන් එක් ග්‍රහයෙකි. තවද සතියේ එක් දිනක් ගුරුදා වශයෙන් නම්කර ඇත. ගුරු යනුවෙන් වර්ණයක් ද අප අතරේ තිබේ. බුද්ධියට අධිපති ග්‍රහයා ද ගුරුය. තවද ගුරු යනු ආලෝකය දෙන්නා යන නාමයට තවත් පර්යාය පදයකි. නැතිනම් මග පෙන්වන්නාටද ගුරු කියා භාවිත කරේ. ආලෝකය දෙන්නා නොහොත් මග පෙන්වන්නා අර්ථයෙන් අර්ථ ශාස්ත්‍රය කියා දෙන උතුමන් ද ගුරු යන නාමයෙන් හැඳින් වේ. ආලෝකය දීමට නැතිනම් මග පෙන්වීමට වරම් ලැබූ පුද්ගලයා ගුරු+වර නොහොත් ගුරුවරයා ලෙස සරලව අර්ථ කථනය කළ හැකිය. මේ සියලු යෙදුම්වල අර්ථ නිරූපණය එකින් එකට වෙනස් වුවත්, මෙහි අරමුණ එම තේරුම් විග්‍රහ කිරීම නොව, ශිල්ප ඥානය බෙදාදීමට වරම් ලැබූ ගුරුවරයා පිළිබඳ කියවෙන ගීතයකින් ගුරු භූමිකාවේ අතීත හා වර්ථමාන තතු විමසා බැලීම වේ.

සැබවින්ම ඔවුහු අපූරුය. දැනුමෙන්, බුද්ධියෙන් පමණක් නොව විචාරාත්මක දැසකින් ඔවුහු පොහොසත්ය. දැනුම අසම සමය. බුද්ධියෙන් අනූනය. ඇසුපිරුතැන් ඇත්තෝ වෙති.

ඔවුහු නිස්‍යාධෂයෙන් කටයුතු කරන්නේ යැයි පැවසුව හොත් මුසාවකි. එහෙත් ලැබෙන වැටුපට වඩා සියක් ගුණයක් ඔවුහු සේවය කරති. ඔවුන්ගේ ප්‍රාර්ථනාවන් උත්තරීතරය. සැමවිටම පැතුවේ සුපසන් ලෝකයකි. ඔවුහු වරදකට චූදිතයාට දඬුවම් කරනුයේ වෛර සිතකින්, නොව මෛත්‍රිය පිරුණු සිතකිනි. ඒ යම් කලක වෛරී සිතින් සමාජය දෙන දඬුවම් වළක්වනු පිණිසය. හේ වෙන කිසිවෙකු නොව ගුරුවරයා වේ. ඒ මිට දශක තුන හතරකට පෙර විසූ ගුරුවරයා වේ.

**පැන මඩ කඩිති වැව් තාවල වැහි කාලේ**
**පෙන්නා මග නොමග නොවැටී යන තාලේ**
**සිප් කිරි පෙවූ මූසිලයින් උඩුමාලේ**
**අපෙ ගුරුතුමා යයි තාමත් ඉස්කෝලේ**

පළමු සිව්පද පෙළ ගැස්ම තුළ අපූර්ත්වයක් දැනේ. ''පැන මඩ කඩති වැව් තාවල වැහි කාලේ'' එහි අපූරු රූපලාංකාරයක් මෙන්ම යටිපෙළ අරුත් ගැන්වීමක් ඇත. වැව් තාවල්ල මතින් වැහි කාලයේ මඩ කඩිති පැන පැන යන පාසල් ළමෝ රැසක් ද, වේවැලක් අතින් ගෙන සන්කරමින් ඔවුනට මග පෙන්වන ගුරුවරයෙකු ගේ රූපකාය ද අපගේ දෙනෙත් මානයේ මැවී යයි. ඒ රූපාලංකාරයයි.

ජීවිතයේ ගමන් මග අකේව්දී දුක්ඛ දොම්මනස්සයන්ගෙන්, බාධාවන්ගෙන් පිරුණු එකකි. එහි යායුත්තේ සිහි බුද්ධියෙනි. නැතිනම් කොතනකදි හෝ අවහිරයක්, බාධාවක් සිදුවීම වැළක්විය නොහැක. එසේ බාධාවන් මගහැර යෑමට නම් යන මග හඳුනාගත යුතුය. එයට පෙරමග ගමන්කරුවෙකු සිටිය යුතුය. නැතිනම් වන්නේ විනාශයකි. අතරමංවීමකි. ගුරුවරයා කරනුයේ යන මග එළිපෙහෙළි කර දීමය. කරදරයක නොවැටී ජීවන ගමන ගෙනයන හැටි කියා දීමය. ඒ එහි යටි පෙළ ඇරත් ගැන්වීමයි.

**සිප් කිරි පෙවූ මූසිලයින් උඩුමාලේ**
**අපෙ ගුරුතුමා යයි තාමත් ඉස්කෝලේ**

මෙහිදි අපට ගුත්තිල ජාතකය සිහි වේ. ගුත්තිල ඇදුරිඳු ගෙන් වීනා වාදනය පිළිබඳ ශිල්ප ඥාණය පොහොසත් කර ගත් මූසිලයන් තම ගුරුවරයා පරාජය කරන්නට දත කෑවේය. කොහොදෝ සිට ආ ශක්‍රයා ගුත්තිල ඇදුරිඳු බේරාගත්තේය. ඒ එදාය. එහෙත් පවතින සමාජ අර්ථ ක්‍රමය තුළ ශක්‍රායද අසරණය. ඉට වඩා බල සම්පන්න අය සිටිති. වත්මන වන විට ගුරුවරයා එක් වරක් නොව සිය දහස් වරක් මූසිලයාට පැරදී තිබේ. ඒ දැනුමෙන් බුද්ධියෙන් නොව මූසිලයාගේ ක්‍රියාකරකම් තුළිනි.

ගුරුවරයාගෙන් ශිලප ඥාණය ලබාගත් මූසිලයන් උඩුමහල් ගතව අනේක විධි සැප සම්පත් විඳිති. මුදල මත සියල්ල තිරණය වන සමාජවතාවරණයක් තුළ ඔවුන් නිසි හෝ අනිසි ලෙස මුදල් හරි හම්බ කරගෙන සමාජයේ ඉදිරියට ගොස් ඇත. එහෙත් ඔවුනට ශිල්ප ඥාණය දුන් ගුරුවරයා තවමත් මඩ කඩිත පැන පාසල් යති. කුමක් දෝ මේ අරුමය...? වරද කාගෙද? ගුත්තිලගෙද ? මූසිලගේ ද ...? ගුරුවරයා හරි මග කියාදුන්නත් ඔහු තනිකර මූසිලයා පමණක් උඩුමහල් ගියේ කුමණ හිණි පෙත්තක නැගලා ද? මෙය විචාරක්ෂිය යොමුකල යුතු සමාජ බේදවාචකයකි. මොවුන් දෙනොම මෙයට වගකිව යුතු නැත. වගකිව යුතු වන්නේ පවතින සාමජ ක්‍රමය හා එය නිර්මාණය කළ වුන්ය. පෙර කළ ගුරවරයා ප්‍රතිපත්ති ගරුකය. ඒ නිසාම ඔහු ප්‍රතිපත්ති රකිමින් ජීවත් වෙති. එහෙත් ඔහුගෙන් ශිලප ඥාණය ලැබූවන් මහා සංස්කෘතිය විසින් ගිලගත්තේය. ඒ බල්ලෝ මරලා හරි මුදල් සොයන සංස්කෘතියයි.

**සාමා අමර විකුණති බස් පොලේ කජු**
**කුමාරෝද පිටු දන්දෙති එයින් මතු**
**උගතමනා ශිල්පය පිල්කඩ නොපැතූ**
**වේවැල වටා ඉකිබිඳ දඬුවමක් පැතූ**

මෙම පද පෙළ ගැස්මේ යටිපෙළ අරුත් ගැන්වීම ඒකකි. මතුපිට අරුත් ගැන්වීම තවත් එකක් ලෙස පෙනේ. හරිහැටි ශිල්ප ඥාණය ලැබීමට පින නොමැති අමර ලා, සාම ලා, කුමාරෝදය පුස්තකයේ කොළවල ඔතා රටකජු විකුණති. මෙයද එක්තරා සමාජ බේදවාචකයකි. ඇති හැකි අයගේ සාම ලා, අමර ලා බෙනස් රියෙන් ගොස් මුදලට ශිල්ප ඥාණය ලබාගන්නා විට, අපේම සමාජයේ තව කොටසක් බස් පොලේ රටකජු විකුණමින් ජීවිතය සොයා යති. එහි යටි අරුත එයයි. නමුදු මුදල මත සියල්ල තීරණය වන සමාජ ක්‍රමයක් තුළ සමහර සාමලා ට, අමර ලා ට ශිල්ප ඥානය වගේ වගක් නැතුවා වාගේය. ඔවුනට ඇවසි වන්නේ මුදල්ම වේ. අල්ලට සිඟා හෝ රස නැති කැවිලි කකා පාසල් අධ්‍යාපනය ලැබූවත් ඉන්පසු සිදුවන බේදවාචකය ඊටත් වඩා බැරෑරුම්ය. මන්ද අප රටේ විශ්ව විද්‍යාලයකට සුදුසුකම් ලැබ කැඳවීම ලැබෙන්නට කාලයක් යති. ඇතුලත් වූවත් ඉන් අධ්‍යාපනය හමාර කොට පිටවන දිනයක් කියන්නට බැරිය. මන්ද වසරේ වැඩි කාලයක් අප රටේ විශ්ව විද්‍යාල අරගල නිසාවෙන් වසා තිබේ. ඉතින් ශිල්ප ඥාණය ලැබීම කුමක් සඳහා? කෙලෙසක හෝ එම බැරි අමාරුකම් දරාගෙන ශිල්ප ඥාණය ලැබූවත්, රැකියා පෝළිමේ කලක් බලා සිටිය යුතුය. එසේ ඉද හෝ ලබාගන්නා රැකියාවෙන් ලැබෙන වැටුප ජීවිතය ගොඩනගා ගැනීමට තරම් ප්‍රමාණවත් ද?.

**රන්මසු පටපිලී අභරන උරන වෙලා**
**සමන් පිච්ච කැකුලිය ගෙයි මිලින වෙලා**
**ගුරු නිවහනේ කඳුලට උල්පතක් වෙලා**
**ලොකු හාමිනේ ඇත බිතු සිතුවමක් වෙලා**

ඒ පුරුෂාර්ථ සිඳබිඳ නොගත් ගුරුවරයාගේ බේදනීය ජීවිත යයි. ඔවුන්ට කිසිදාක රන් අභරන පටපිළි උරුම වන්නේ නැත. මන්ද ඔහු සැබෑම ගුරුවරු නිසාවෙනි. ඔහුගේ ශිල්ප ලබාගත් මූසිලයින් සේ ඔහු ටියුෂන් කඩ දමා මුදල් ඉපයුවේ නැත. හොර කොමිස් ගසන හැටි දන්නේ නැත. දන්නෙ යහ ගුණ කියාදීම පමණි. ලැබෙන වැටුපෙන් ජීවිතය ගැටගසා ගන්නා විනා ඔහුට වෙනත් විකල්පයක් නැත. ඒ නිසාම ඔහුගේ දීගතල දෙන වයසේ දියණිය නිදිපැඳුරට වියපත් වෙමින් සිටි. (සමන් පිච්ච කැකුලිය ගෙයි මිලින වෙලා) ඒ නිසාම ඔහුගේ කුටුම්බිය කඳුලු උල්පතක් බවට පත්ව තිබේ. ඒ කඳුලු කාගේ ද?. වෙන කිසිවෙකු ගේ නොව ප්‍රිය බිරින්ද වූ ලොකු හාමිනෙගේය. ඇය හුල්ලන්නේ කඳුලු හෙලන්නේ තම දියණිය නිසාවෙනි. දියණිය කණවැන්දුම් වීම මවක් කෙසේ දරාගන්නේද? ලොකු හාමිනේ ද ගුරුවරියකි. මිට දශක තුන හතරකට පෙර එය සම්මතයක් වී තිබුණේය. අනේක වූ දුවා දරුවන් නැණ ගුණයෙන් පොහොසත් කළ ගැහැණියකි. එහෙත් ප්‍රතිපත්ති ඉදිරියේ ඇය ගල්බීත වී ඇත. කරකියා ගත දෙයක් නොහැකිව ඇය දැන් ගුරු නිවහනේ බිතු සිතුවමක් බවට පත්ව තිබේ. සරලව කිවහොත් ඇය ඒ අතීත ගුරු පරපුර රැකි පුරුෂාර්ථ දැන් නෂ්ඨාවශේෂ වෙමින් තිබේ. මුදල ඉස්මතු වෙමින් ඇත.

විමසුම ලා/කෝ සුජීව කුමාර කෝවිලතැන්න

**ගෞරවනීය තනතුරකට...**
2 වන පිටුවෙන්...

තවද විවිධ සම්මන්ත්‍රණ හා වැඩමුළු රැසකට සහභාගී වී ඇති මෙම නිලධාරී ජාතික හා ජාත්‍යන්තර වෘත්තීය ආයතන වල සාමාජිකත්වයද දරයි.

- නායකත්ව හා ඵලදායිතා සංවර්ධන වැඩමුළුව
- නායකත්ව හා කණ්ඩායම් කළමනාකරණය වැඩමුළුව
- මානව හිමිකම් වැඩමුළුව
- තත්ව කළමනාකරණ ක්‍රමවේද වැඩමුළුව
- උපාය මාර්ගික සැලසුම් වැඩමුළුව
- ළමා උපදේශනය පිළිබඳ වැඩමුළුව
- නව ඵලදායිතා උපාංග පිළිබඳ වැඩමුළුව
- විදුලි ශක්ති කළමනාකරණය පිළිබඳ වැඩමුළුව
- ජාතික මානව සම්පත් සම්මන්ත්‍රණය 2013
- සමාජ ආර්ථික බලපෑමේ යුධමය කාර්යභාරය වැඩමුළුව
- වර්තමාන භූ දේශපාලන යථාර්ථයන් හා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ බලපෑම පිළිබඳ වැඩමුළුව

## වෘත්තීය ආයතන ආශ්‍රිත සාමාජිකත්වය

- කළමනාකරණ ආයතනය ශ්‍රී ලංකාව ආශ්‍රිත සාමාජිකත්වය
- වෘත්තීය මුදල් කළමනාකරුවන්ගේ ආයතන සාමාජික එක්සත් රාජධානිය
- විධායක හා පරිපාලකවරුන්ගේ ආයතනය විධායක සාමාජික එක්සත් රාජධානිය

වසර 136ක ප්‍රෞඪ ඉතිහාසයක් හිමි ස්වේච්ඡා බලසේනාව තවදුරටත් ඉහලට ඔසවා තබමින් එහි සාමාජික සාමාජිකාවන්ගේ අනාගත අභිවෘද්ධිය සැලසීම පිණිස කැපවන්නට නව නියෝජ්‍ය සේනාවිධායක සතු දැනුම හා අත්දැකීම් හරහා නිසැකවම හැකිවනු ඇත. ඒ සඳහා නිබඳ ශක්තිය ලැබේවායි රණවරුණ මෙසේ සුභපැතුම් එක්කරයි

---

### පොත් විකුණන අප්පච්චි

තුනේ පන්තියට
ආයුබෝවන් කියා
ලෝකය ජයගන්න
මට අකුරු කියාදෙන්න
බස්රියේ පොත් විකුණන
මගේ අප්පච්චි

දැනුම වැඩුවෙකු සේ
උගුර ලේ රහවන තුරා
බස්රියේ
කෑ ගසා දැනුම බෙදන
මගේ අප්පච්චි

තාරකා විද්‍යාව
හඳට ගිය මුල්ම මිනිසා
ලෝකයේ දිගම ගංගාව
එකදිගට කියාදෙන
මගේ අප්පච්චි

තාම නැතේ ගෙදර ආවේ
පොත් විකුණා ගන්න
සොච්චමෙන්
රෑ බඩගිනි නිවා ගන්න
පාන් ගෙඩියක් රැගෙන
මගේ අප්පච්චි

**මේජර් කේකේඑස් කුමාර ශ්‍රීලංජාආබමු**
ප්‍රමානි II පුහුණු
ශ්‍රීලංයුහසෙව්බමු.

### මිතුරිය

පංසල ඉදිරිපිට
ඇත මිතුරේ
නුඹ නිවස
එනමුදු හිතේ
ගුණදම් නැහ
රැදුණ
පංසල් බිමේ
සෝදාහල
හිත්මල කහට
ගලාවිත් රැදුනිද
මිතුරේ නුඹේ සිනාව

**හේෂාන් කෞෂල්‍ය හේරත්**
කුලියාපිටිය.

### මුව ගොළු වීද...?

මුව ගොළු වීද...
හදවත ගොළු වී නොමැති සඳ...
අරුමැසි ප්‍රේමයේ
අරුමය දැනෙයි මට

දෙබසින් කියන
රහසට
වැඩියෙන්
සබඳ
දෙනුවන් කියන රහසේ
රස රහස් ඇත...

**ලා/කෝ සාලිය බණ්ඩාර ඕයුළු**
3(සෙව්) ශ්‍රීලංසිරෙ

# කවි මල් යාය

## රණවිරු සෙතට තැනදෙමු සුව සතුට ලද

අව් වැසි පිනි සමඟ ගහකොළ වැවෙන බිම
මානව පරපුරක උරුමය දකින ඉම
සළකුණු කරන සුරකින හැම මොහොතකම
රණරුවි සවිය පිටු බලයකි නොවන ඉම

විත් ගංවතුර මතු වී රිදුමේ කඳුළු
නායේ ගොසින් ගේ දොර උස් කඳු වළලු
සිදුවූ විපත් දුක  කඩිනම් බව ඉසිලූ
රණවිරු මෙහෙවරට මුළු දූය ණය ගැතිලු

අහසින් ගොඩින් සයුරෙන් දස්කම් පානා
දැඩි අරමුණක නියැළෙන විමසුම් මානා
සිහියට නැගෙන විට දූය රණවිරු සේනා
ලක්මව කඳුළු පිස හිනැහෙන්නට ඕනෑ

ඔළ මොළ රුපුන් සිඳ බිඳ එඩි බලය පැතූ
බිව් සැටි සටන් බිම ජයපැන් සිතිය යුතු
රණවිරු දිරිය දුක අබිමන් ගමන සිසි
සුරකිමු ලබා දී සහනය නමැති මුතු

පැවත් කොතෙක් දස්කම් නිළ ඇඳුම ඇඳ
ඒ හැමටත් තිබේ ජීවන ගැටලු අද
සලකා එ ගැන මානව ගුණ සුවඳ මැද
රණවිරු සෙතට තැනදෙමු සුව සතුට ලද

**කොස්කඳවල නන්දසේන වීරසිංහ**

## කවි බංකුව

කජු ගහ යට
කවි බංකුව
පරණ ලෑලි
යොදා සැදුව
වෙල ළඟ ඇති
කවදාවත් පරණ නොවන
හීතල වූ විට දිවියම
උණුසුම් කරවන තැන
ඒ කවි රසයෙන්
පමණක් නොව

අපේ දුක සැප දෙක
එකසේ බෙදා ගන්න
කතා කරන්නට බැරි මුත්
අපේ කතා හැම අඳුනන
වෙල ළඟ ඇති
කවි බංකුව

සේකරලගේ  නන්දනලගේ
රතන ශ්‍රී ගේ මස්ඉඹුලගේ
කවි ගැන පැය ගනණක්
කතා කරපු එනමුදු
කාලය නොගටෙන තැන
ජීවිතයම අලුත් කරන
ඒ මිහිපිට තැන
වෙල ළඟ ඇති කවි බංකුව

**කපිල ජයවිලාල් හේරත්**
**කුලියාපිටිය.**

## මා උපන් දේශය

රන්වැලි සෑ රජ හා මහ බෝ රජ
පතුරයි ලොවටම දහම් සිසිලස
පවවලින් මුදවා දනන් කැල
ගුණ දහම් පතුරවලයි දසත

ලොව දනන් මවිත කළ
අටමස්ථානය ද නටඹුන්
පවසන්නේ ඒ අපේ උරුමයයි
ඔබයි මෑණියන් මා උපන් බිම

රහතුන් පහස ලද
තෙරුවන් නිති වැඩ සිටින
වැජඹෙනු මවිනි අනුරපුර
පතුරා ලොවට සව්සෙත

**සෙ/19ඊ00492**
**ලා/කෝ ගුණවර්ධන එස්එම්ඒකේජේ**
19(සෙව්) ශ්‍රීලංසිරෙ

## ආදර මාවත

ජීවිතය නමැති මහා මාර්ගයෙහි
ආදරය නමැති
අතුරු මාවත වෙත පිවිසි අප
විවාහය නමැති
පටුමගෙහි
නැවතී
සෙනෙහස
ආදරය
කරුණාව නමැති
සෙනෙහෙබර
කැදැල්ල තැනීමට
සිහින දකින්නෙමු..

සෙ/එල්100181
**සාසෙ සත්‍යා ජයන්ත පීජේ**
2(සෙව්)ශ්‍රීලයුවෙබ

# කවි මල් යාය

## මේ ආදර කවි ඔබටයි

විඩා බර නෙතු අගට
සහස් සෙනෙහස ගෙනා
අසීමිත ප්‍රාර්ථනා වන්නේ
දයාබර උල්පතයි ඔබ

පවිත්‍ර චේතනාවන්
හදේ දරාගෙන පැතුමන්
අන්ධ වූ ආදරයෙන්
දූල් වූ පහන් සිලයි නුඹ

අනේක විද දුක් හමුවේ
දරාගන්න මම සැදුවේ
වැටෙන කඳුළු බිඳු හමුවේ
සිත නිවාලන දහම් පදයයි නුඹ

සැමදා ඔබහට මගේ ආදරයයි
නොවෙනස් වන බව සත්තයි
මියෙන තුරා ලගින්ම ඉන්නම්
මා ආදර මහත්තයෝ...

**සෙ/1ජේ00682 ලා/කෝප්‍රල් රත්නායක ආර්කේඑීඑස්**
**1 ශ්‍රී ලංකා රයිෆල් බලකාය**

## ඔයා මගේ ලග........

දහක් මිනිසුන් ගියත් මගතොට
මං හිනාවත් උනේ නැති කොට
ඔයා ආ හැටි ඇස් අගිස්සට
ඇත්තමයි පුදුමයි අදත් මට

ඔයා මගෙ මං හිතන් හිටියට
හීනයක් තවමත් ඔයා මට
ඉතින් චුට්ටක් ලගින් ඉන්නට
ඇවිත් යනවද විනාඩියකට

**සෙ/එච්101926 සාසෙ වික්‍රමසිංහ එම්පීපීආර්**
**16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව**

## ගැම්ලිය

සිරි සිරි පොද මල්වැස්සේ ඔබ දුටු එක් සැන්දෑවක
එනු දුටුවා නුඹ ලස්සන සුවඳ සමන් මල් යායක
අනාගතේ රැගෙන යන්න සිහින පැතුම් රේඛාවක
නුඹ ගැන මම කවි ලීවේ හුදකලාවේ පුංචි පැලක

ගම්බද සිරි හමා යනව සීත සුළං නිලට නිලේ
කණාමැදිරි එකතු වෙනව පිපෙන කැකුළු සමන් වැලේ
ආදරයක කවි ලියන්න තෙලි තුඩකින් පුංචි කොලේ
බුදු කුටියක එළිය පෙනෙයි නුඹ සිටිනා දිළිඳු පැලේ

ගොපළු කොලුගෙ වස්දඬුරා ගී පදවැල අමුණාලා
එවනව මම ගුවන් තලේ නුඹ සිටිනා පැල සොයලා
ඔබෙ ලස්සන ඡායා ඇත හදවතෙ සිතුවම් කරලා
මුතු වරලස හමා යනව නුඹෙ සඳමඩලම වැහිලා

සතර කොනේ බැමි බැඳලා ඇත මුරකාවල් යොදලා
පොල් අතු පැල වටකරලා නීල ගොයම් ඇත සැදිලා
කැකිරි කොමඩු වැල් පිරිලා සරුවට ඇත ගෙඩි සැදිලා
කිතුල් හකුරු පැණි හදලා ඇත මුලුතැන් ගෙය පිරිලා

ගොඩ මඩ ගොවිතැන් කරලා කුඹුකෙ ලිඳේ දිය නාලා
කොටු කොටු සරමක් ඇඳලා ඉණට හවඩියක් බැඳලා
පාළුව තණිකම පිරිලා අඳුරට දුක එකතු වෙලා
පුංචි පැලට එළිය දෙන්න නුඹ එනවද මගේ මලා

**සෙ/4එස්00078 ඉසෙ වීරරත්න එන්ඒආර්**
**4 ඉසෙරෙ- නල්ලුරුව**




# විවිධ පුවත්



## බිම්කඩේ අයිතිය ලබා

ස්වේච්ඡා බළසේනාවට අයත් 15(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ සුරතින් ස්ථිර භූමියක හිමිකම් ප්‍රදානය කිරීම අනුරාධපුර තලාව මහජන බැංකු ක්‍රීඩාංගනයේ සිදුකරන ලදී. 1997. 01.01 වන දින අලවෙඩ්ඩි ප්‍රදේශයේ ඒකක මූලස්ථානය ස්ථානගත කරමින් ඇරඹි මෙම ඒකකයේ පරිපාලන කටයුතු පහසු කර ගැනීමේ අරමුණින් මහවැලි අධිකාරියේ අවසරය මත නොච්චියාගම හැලඹවැව ප්‍රදේශයේ මහවැලි අධිකාරියට අයත් ඉඩමක පිහිටුවා තිබූ පසු මුලස්ථාන භූමිය සඳහා මේ හිමිකම් ප්‍රදානය කෙරුණි. හෙක්ටයාර් 07කින් යුත් අදාළ භූමියේ හිමිකාරිත්වය පවරන සන්නස් පත්‍රිකාව අතිගරු ජනාධිපති තුමන්ගේ සුරතින් වැ.බ. අණදෙන නිලධාරී මේජර් එම්එම්බීජේඑස්කේ විජයරත්න වෙත පිරිනැමිණ.

## දැනුම දිනා බුහුමන් ලැබූ වගයි...



යුදහමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් එම්එච්එස්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී පසුගියදා ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියකින් පිදුම් ලැබුවේය. එම විෂය සම්බන්ධ ආචාර්ය උපාධියක් හිමි පාබල රෙජිමේන්තුවකට අයත් ප්‍රථම මේජර් ජෙනරාල්වරයා ඔහු වීමද විශේෂත්වයකි.



## පුංචි හපනී

2017 වසරේ පහ ශ්‍රේණිය ශිෂ්‍යත්වය විභාගය සඳහා පෙනී සිටි සිසු සිසුවියන් අති විශාල පිරිසක් අතුරින් දිවයිනේ සිව්වන ස්ථානය හා රත්නපුර දිස්ත්‍රික්කයේ පළමු ස්ථානය හිමිකර ගැනීමට 26 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙ/කියු00710 බළලත් නිලධාරි II ජයරත්න එස්පී ගේ දියණිය වූ එස් ප්‍රසාදි දෙව්මිණි ජයරත්න සමත් වූවාය. ර/ඇඹි/දාපනේ එකමුතු ප්‍රාථමික විද්‍යාලයේ ඉගෙනුම ලැබූ ඇය ලබාගත් ලකුණු ප්‍රමාණය 195කි. දිරිය දියණියට අනාගතය ජයගැන්මට අපිද සුභාශිංෂන පිරිනමමු.

## 6(සෙව්) ශ්‍රීලයුපොදුසේබ ඒකකය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර් පලිහක්කාර යූඑස්පී 2017.10.26 වන දින වැලිකන්ද කන්දකාඩු හී ස්ථාපිත 6(සෙව්) ශ්‍රීලයුපොදුසේබ ඒකකයේ කඳවුරු සංචාරයක නිරත විය. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ට නිලධාරිහු රැසක් ද එක්වූහ.

## 19 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



55 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී පසුගිය සැප්තැම්බර් මස 20 වන දින 19(සෙව්) ශ්‍රීලංසිරෙ ඒකකයේ කඳවුරු සංචාරයක නිරත විය. එම අවස්ථාව සිහිකරණු වස් ඒකක භූමියේ අඹ පැලයක් ද රෝපණය කරන ලද අතර, සියලු නිළ දිවාභෝජන සංග්‍රහයකට ද එදින සේනාංකාධිපති සහභාගී විය. මෙම අවස්ථාවට 551 බසේමු යටතේ රාජකාරි නියුතු 18 (සෙව්) ශ්‍රීලපාහ සහ 20 ශ්‍රීලංජාආබමු ඒකක භඨ පිරිස්ද සහභාගී වූහ.

# ඒකක විත්ති

## සේවා වනිතා සත්කාරයක්




ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකා රෙජිමේන්තු සේවාවනිතා ශාඛාවේ මහා සභා රැස්වීම ඉකුත් දා එහි සභාපතිනී කමණි පලිහක්කාර මැතිණියගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සාකච්ඡා ශාලාවේ දි පැවත්විණ. එහිදි 2(සෙව) ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකායට අයත් ලා/කෝප්‍රල් ප්‍රේමතිලක යන කොනොනි හට තම දියණියගේ කොඳු ඇටපෙලේ මතුව ඇති අබාධයක් හේතුවෙන් නවලෝක රෝහලේ දි සිදුකළ සැත්කමක් වෙනුවෙන් රුපියල් ලක්ෂ දෙකහමාරක (රුඃ 2 50000.00) මුදල් ප්‍රදානයක් සිදුකරන ලදී.

## ජන ඇමතුම් උපකරණ පරිත්‍යාගයක් ...



පසුගියදා 55 වන සේනාංක බළඇණි පුහුණු පාසලෙහි පුහුණුවීම් නිමාකළ 12(සෙව) විජයබාහු පාබල රෙජිමේන්තු සාමාජිකයින් විසින් ජන ඇමතුම් උපකරණ කට්ටලයක් එම පුහුණු පාසල වෙත පරිත්‍යාග කරන ලදි. මෙම අවස්ථාවට 55 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්ඒච් මුහන්දිරම් ආර්එස්පී, 553 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් ඒපීඩීඑන් ජයසුන්දර ආර්ඩබ්පී ආර්එස්පී 12(සෙව) විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිළධාරි මේජර් එච්ඩබ්ලිව්ජ් බණ්ඩාරනායක හා බළඇණි පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක මේජර් කේජේආර්එස් පෙරේරා යන නිලධාරි හූ ද සෙසුනිළයෝ රැසක් ද

## කපිතාන් සාලිය අලදෙනිය සමරා





1990 වසරේ කෝකාවිල් ප්‍රහාරයේ දි දිවිපිදු 3(සෙව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේනතුවට අයත් කපිතාන් සාලිය අලදෙනිය රණවිරුවා ඇතුලු පිරිස සිහිකරමින් පසුගියදා 3(සෙව) ශ්‍රීලංසිරෙ ඒකක රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර පිදීමක් සිදුකරන ලදී. ඒකක වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව්ඒඑම් රණතිලක ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් පැවති එම සැමරුම් උත්සවය කොකාවිල් ත්‍රස්තවාදි ප්‍රහාරය සිදුවී වසර 27ක් පිරීම නිමිත්තෙන් සංවිධනය කරන ලද්දකි.

## නව භට නිවාසයක්...



කිලිනොච්චි අක්කරායන්කුලම් ප්‍රදේශයේ ස්ථාන ගතව රාජකාරියේ යෙදෙන 7 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අවම මට්ටමේ පැවැති නේවාසික පහසුකම් ප්‍රශ්නයට විසඳුමක් ලෙස ඉදිකරන ලද අංග සම්පූර්ණ භට නිවාසයක් පසුගියදා සෙසු නිලයින්ගේ අයිතියට පැවරුණි. අණදෙන නිලධාරි මේජර් එච්එම්කේ දේශප්‍රිය ශ්‍රීලංජාආබමු ගේ පූර්ණ මැදිහත්වීම මත ඉදිකළ මෙම භට නිවාසය සඳහා 2017 වර්ෂයේ යුද්ධ හමුදා මුලධන සේවා ඇස්තමේන්තුව යටතේ රුපියල් ලක්ෂ හයක පමණ මුදලක් ලබාදී තිබුණි. මෙම නව භට නිවාසයේ ආබාධිත සෙබලුන් උදෙසාද අවැසි පහසුකම් තිබීම විශේෂත්වයකි. ඒකක සමාජිකයින් මෙම ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය දැක්වීය.

# ඒකක විත්ති

## 9 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව



9(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සේවයේ නිරතව මව්බිම වෙනුවෙන් අමරණීය මෙහෙයක් ඉටුකර මේ වන විට විශ්‍රාම සුවයේ කල්ගෙවන නිලධාරින්, අණදෙන නිලධාරිවරුන් හා විශ්‍රාමික සෙසු නිලයින් ගේ සහභාගීත්වයෙන් පසුගියදා කැළණිමුල්ල කඳවුරේදි සුහද හමුවක් පැවැත් විණ. 9(සෙව්) ඒකකයේ වත්මන් වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහගේ සංකල්පයක් අනුව පැවත් වූ මෙම සුහද හමුව පැරණි මතක අලුත්කල සොඳුරු අවස්ථාවක් විය.

## 3(සෙව්) සන්නද්ධ බුදධි බලකාය



3(සෙව්) සන්නද්ධ බුදධි බලකා වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව්එම්ජේකේ කරුණාරත්න අර්එස්පී අයිඑස්සී සබුබ ගේ උපදෙස් මත ඉදිකළ ඒකක බනි සැර නිවස්න නව නේවාසිකාගාරය පසුගියදා අණදෙන නිලධාරිගේ සුරතින් එම ඒකක ජ්‍යෙෂ්ඨ කොනොනින් ගේ අයිතියට පවරන ලදි. මෙම නේවාසිකාගරය ඉදිකිරීම ඒකක සෙසුනිලයින් ගේ ශ්‍රමදායක්වය මත සිදුවීම විශේෂත්වයකි.

## 9 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව



ආරක්‍ෂක සේනා මුලස්ථාන (යා) අඟාපති මේජර් ජෙනරල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ජ්ඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එන්ඩීසී පසුගියදා 9 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ නිරික්‍ෂණ චාරිකාවක නිරත විය. එහිදි එම ඒකක සමාජිකයින්ගේ සුවදුක් විමසා බැලීමටද හෙතෙම අමතක නොකළේය.

## 16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව



යාපනය ප්‍රදේශයේ ස්ථානගත 16(සෙව්) විපාරෙ ඒකකය විසින් පසුගියදා එම ඒකක සාමාජිකයින් ගේ හා සිවිල් සේවක මහතුන්ගේ දැනුම, විනෝදය පිණිස විනෝද චාරිකාවක් සංවිධානය කර තිබුණි. යාපනය ප්‍රදේශයේ ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන දැකබලා ගැනීම හා එම ස්ථාන පිළිබඳ ඔවුනට අවබෝධයක් ලබාදීම මෙම චාරිකාවේ අරමුණ විය. මේ සඳහා ඒකක සාමජිකයෝ විශාල පිරිසක් එක්වූහ.

## සය වසක අභිමන් සමරා ...



6(සෙව්) ශ්‍රී ලංකා පොදුසේව බලකාය සිය හයවන ස.වත්සරය පසුගියදා යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැන දෙමින් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්කේඑස්එස් ද සිල්වා ශ්‍රීලයුපොදුසේබ ගේ ප්‍රධානත්වයෙන් සමරන ලදී.

# ඒකක අභිමන් සමරමින්...

## 22 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශයේ වල්ලෙයිහි ස්ථානගත 22 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සිය 19 වෙනි සංවත්සරය ඉකුත් ජූලි 28 වන දින අණදෙන නිලධාරි මේජර් එච්එම්යූඩී හේරත් ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් සමරන ලදී. ආගමික වතාවත්වලට හා යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් පැවැත් වූ සංවත්සර කටයුතු සඳහා සියලු නිලයෝ සාමූහිකව එකතු වූහ.

## 10 (සෙව්) ගැමුණු හේවා බළඇණිය



ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාවට අයත් පාබළ ඒකකයක් ලෙස 1994.06.01 වන දින ස්ථාපනය කරන ලද 10(සෙව්) ගැමුණු හේවා බළඇණිය සිය 23 වන සංවත්සරය පසුගියදා හම්බන්තොට බැල්ලගස්වැව දී අණදෙන නිලධාරි මේජර් එම්ඒඩීඑස් මුතුකුඩ ගැහේබ ගේ ප්‍රධානත්වයෙන් සමරන ලද්දේ ඒකකයේ සියලු නිලයන්ගේ සාමූහික සහභාගීත්වයද ඇතිවය.

## 2(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



දිගු ඉතිහාසයකට නෑකම් කියන 2(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සිය 61වන සංවත්සරය පසුගියදා අභිමානවත් අයුරින් වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඒඑම්ඩබ්ලිව්පී අබේසේකර ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් සමරන ලදී.

## 7 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



කිළිනොච්චි අක්කරායන්කුලම් ප්‍රදේශයේ ස්ථානගත 7 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සිය 10 වන සංවත්සරය වැ.බ. අණදෙන නිලධාරි මේජර් එච්එම්කේ දේශප්‍රිය ශ්‍රීලංජාආබමු ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සමරන ලදී. යුද හමුදා සම්ප්‍රදායන් ආරක්ෂා කරමින් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් මෙම සංවත්සර උත්සවයේ වැඩ කටයුතු සිදුකෙරුණි.

# ඒකක අභිමන් සමරමින්...

## 8 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



8 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සිය 10 වන සංවත්සර වැ.බ. අණදෙන නිලධාරී මේජර් යූවීසී පුෂ්පසිරි ශ්‍රීලංජාආබමුගේ ප්‍රධානත්වයෙන් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් අභිමානවත් අයුරින් පසුගියදා සමරන ලදී.

## 2 වන යුද්ධ හමුදා පුරෝගාමී බලකාය



2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය සිය පළමු සංවත්සරය පසුගියදා උතුරු පිටිගල ස්ථානගත අභිනව කඳවුරු පරිශ්‍රයේදි අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑස් කොළඹආරච්චි ශ්‍රීලයුපුබ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් සමරන ලදී.

## 3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අභිමානවත් 48වන සංවත්සරය එහි වැ:බ අණදෙන නිළධාරි මේජර් ඩබ්ලිව්ඒඑම් රණතිලක ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ඒකක මුලස්ථානය ස්ථාපිත නුවරඑළිය කඳවුරේ දි සමරන ලදි.

## 3(සෙව්) ගැමුණු හේවා බළකාය



ඓතිහාසික රුහුණු පුරවරය කේන්ද්‍රකර ගනිමින් 1965.09.01 මාතර ලන්දේසි කොටුවේ ස්ථාපිත කරන ලද 3 (සෙව්) ගැමුණු හේවා බලඇණිය සිය 52වන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරි මේජර් වයිඑම්ජේ ඥණධාර ගැහේබ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් සමරන ලදි.

## 19 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



යාපනය, පේදුරුතුඩුව ප්‍රදේශයේ ස්ථානගත 19(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සිය නවවන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරි මේජර් එච්එම්යුඩී හේරත් ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් සමරන ලදී. බළඇණි දිනයට සමගාමිව අණදෙන නිලධාරි වෙත කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීම ද සිදුකරන ලදි.

# ජනසෙත සදමින්

## ඩෙංගු උවදුරට වැට බඳිමින්...




දිවයිනේ බොහෝ ප්‍රදේශවලට මහත් බලපෑම් කර ඇති ඩෙංගු රෝග වසංගතය දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේද මේ වන විට හිස ඔසවා ඇත. එලෙස ව්‍යාප්ත වන ඩෙංගු වසංගතය මැඩලීමේ අරමුණින් පසුගියදා 3(සෙව්) කාන්තා බලකා සෙබළියන්ගේ ශ්‍රමදායකත්වයෙන් ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. 3(සෙව්) කාන්තා බලකා වැඩ බලන අණදෙන නිලධාරිණී මේජර් එල්ආර්ටීඑන් ලියනගේ ශ්‍රීලයුකාබ ගේ අධීක්‍ෂණය යටතේ පැවැති මෙම ඩෙංගු මර්ධන වැඩසටහන යටතේ මදුරු කීටයන් වර්ධනය වන ස්ථාන විනාශ කිරීමට ප්‍රමුඛතාවය ලබාදී තිබුණි. මෙම ප්‍රජා සත්කාරය සඳහා ප්‍රදේශයේ සිවිල් ජනයාගේ සහයෝගය මෙන්ම ප්‍රශංසාවද හිමිවිය.

## විපතට පත්වුවන්ට සහන සලසමින්




පසුගිය මැයි මස දිවයිනට බලපෑ අයහපත් කාලගුණය හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයට අයත් නෙළුව, තවලම, හිනිඳුම, උඩුගම, බද්දේගම ආදි ප්‍රදේශයන් හි අවතැන් වූ ජනතාවට සහන සැලසීමට 16(සෙව්) ගැමුණු හේවා බලඇණිය පෙරමුණ ගන්නා ලදි.

මෙහිදි ගංවතුරට මැදිව ජීවිතයත් මරණයත් අතර සටන් කළ පිරිස් බේරාගැනීමටත්, අවතැන් ජනයා වෙත සහන සැලසීමටත් ඔවුන් ක්‍රියා කරන ලදී. තවද ගංවතුර තත්ත්වය නිමවීමෙන් පසු රජයේ කාර්යාලීය ගොඩනැගිලි, රජයේ රෝහල්, පාසල්, ආගමික ස්ථාන යථාතත්ත්වයට පත් කිරීමටත්. මහාමාර්ග පිළිසකර කිරීමටත් එම ඒකක හය පිරිස් ක්‍රියා කළ අතර, එය ප්‍රදේශයේ ජනතාවගේ ඉමහත් පැසසුමට ලක්විය. වැඩ බලන අණදෙන නිලධාරි මේජර් ඩීවීවීඩබ්ලිව් දේශප්‍රිය ගැහේබ ගේ උපදෙස් හා පූර්ණ අධීක්‍ෂණය මත නිලධාරිහු 04ක් හා සෙසු නිලයෝ 150ක් එකි කටයුතු සඳහා එක්වූහ.



## බීමට දිය පොදක්...

උද්ගතව තිබූ නියං කාලගුණ තත්ත්වය හේතුවෙන් පිඩා විඳි පුලුකුනාව ප්‍රදේශයේ ජනතාව වෙත පානීය ජලය බෙදාදීමක් පසුගිය දා 23 වන සේනාංකයේ උපදෙස් මත සිදුකරන ලදී. මෙමඟින් ප්‍රදේශයේ විශාල පිරිසකට සෙත සැලසුනු අතර, මෙම සත්කාරය 4 වන ගැමුණුහේවා බලඇණිය විසින් සිදුකරන ලදී.

# ජනසෙත සදමින්

## සෙනෙහස බෙදමින්



3 (සෙව්) සන්නද්ධ බුද්ධි බලකාය විසින් හිඟුරක්ගොඩ ප්‍රදේශයේ පිහිටි "මිහිරි කාන්තා සුරැකුම් මධ්‍යස්ථානයේ" නේවාසික කාන්තාවන් සඳහා පසුගියදා දිවා ආහාර වේලක් ලබා දීමට ක්‍රියා කරන ලදී. තවද ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය බඩුබාහිරාදිය ද එදින පිරිනමන ලදී. ශ්‍රී ලංකා යුද හමුදා සේවා වනිතා ඒකකයේ උපදෙස් මත මෙම සත්කාරය ක්‍රියාවට නැංවිණ·

## ලෝක ළමා දිනය සමරා



පසුගිය ඔක්තෝම්බර් 01 වන දිනට යෙදි තිබු ලෝක ළමා දිනය සමරා ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) අඥාපති මේජර් ජෙනරාල් ඩීඑන්එස්කේ සේනාධිර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු ගේ උපදෙස් මත ප්‍රදේශයේ ළමයින් වෙනුවෙන් විනෝදාත්මක වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් සඳහා පොළොන්නරුව, වැලිකන්ද ප්‍රාථමික විද්‍යලයේ සිසු දරුවෝ හා ගුරු හවතුන් එක්වූහ.



## හිසට සෙවණක්

ආරක්ෂක සේනා මූලස්ථාන (යාපනය) ආඥාපති ගේ උපදෙස් මත එම බලප්‍රදේශයේ ජීවත්වන දිළිඳු සිවිල් වැසියන් වෙත නව නිවාස තනාදීමේ ව්‍යාපෘතියක් මේවන ක්‍රියාත්මක වෙමින් තිබේ. එ අනුව 14(සෙව්) ගැමුණු හේවා බළඇනිය විසින් ඉදිකරන ලද නව නිවසක් පසුගියදා එම නිවැසියන් වෙත භාරදුන් අවස්ථාව...

## නැණ නුවන වැඩීමට දිරි දෙමින්






පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දිඹුලාන හා සිංහපුර යන පාසල් සඳහා අවශ්‍යතාවයන් දෙකක් සපුරා දීමට ආරක්ෂක සේනා (නැගෙනහිර) අඥාපති මේජර් ජෙනරාල් ඩීඑස්එන්කේ සේනාධීර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ මැදිහත්වීමෙන් පසුගියදා සිදු කෙරිණි. දිඹුලාන පාසල් පුස්තකාලය නවීකරණය කිරිම නිට්ටඹුව ගංගා ව්‍යාපාරය විසින් එහි නිර්මාතෘ එල් නාරංගාඩ මැතිතුමා හා රණවිරු කපිතන් පාලිත ජයවර්ධන සිහිකිරීම පිණිස සිදුකල අතර, කොළඹ රාජකීය විදුහලේ චිරාත් චමිරංග මුණසිංහ සිසුවාගේ 25 වන ගුණානුස්මරණය වෙනුවෙන් එම පවුලේ ඥාතින් සිංහපුර පාසලේ පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමට අනුග්‍රාහක දායකත්වය දක්වන ලදී.

# සම්මාන තුනකින් පිදුම් ලැබූ

# වැ කඩවර












ඔහු අවියට මෙන්ම පන්හිඳට ද එකසේ පෙම් බැන්දේය. ඒ නිසාම ගිනි ඇවිලෙන යුද පිටියේදී පවා ලැබෙන කෙටි විරාමයේදී පන්හිඳ අතට ගන්නට ඔහු හුරු පුරුදු විය. එහි අවසන් ප්‍රතිපලය වූයේ ඔහු ලියූ කෘති කිහිපය වුව ජාතික මට්ටමේ සම්මානයන්ට පාත්‍ර වීමය.

2000 වසරේදි උතුරු යුද බිමේ සිට ''පිවිතුරුය පළමු පෙම'' නමින් යොවුන් නවකතාවක් ලියා පළකොට සාහිත්‍යකරණයට අත්පොත් තබන ඔහු දිර්ඝ නිහැඬියාවකින් පසු ''ඌවේ වංහුං'' නමින් පර්යේෂණාත්මක ශාස්ත්‍රීය කෘතියක් ලියා 2015 වසරේදී ජනගත කළේය. එය ඌව පළාත පිළිබඳව මෙතෙක් තනි පුද්ගලයෙකු කළ විශාලතම පර්යේෂණ ග්‍රන්ථය ලෙස විද්වතුන්ගේ ඇගයීමට ලක්විය. ''ඌවේ වංහුං'' සොයා ගිය ගමනේ දී හමුවූ අඩුම කුඩුම එකතු කොට පිරිපහදු කර 2016 වසරේ දී ඔහු ''වැ කඩවර'' නමින් ඓතිහාසික තොරතුරු අසුරෙන් යථාර්ථවාදි ශෛලයේ නවකතාවක් ලියා පළකළේය. එය 2016 වසරේ ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළලේදී වසරේ ප්‍රශස්තම නවකතාව ලෙස ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබුවේය. ඉන් නොනැවතී 2017 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළලේ දි අවසාන වටයේ නිර්දේශිත කෘති සම්මානයෙන් පිදුම් ලැබූ ''වැ කඩවර'' 2017 ගොඩගේ ජාතික සම්මාන ප්‍රදානයේ දි වසරේ නවක නිර්මාණ විශිෂ්ටතම සම්මානයෙන් ද පිදුම් ලැබිය. මෙම ජාතික සම්මාන ප්‍රදානෝත්සවය සඳහා ක්ෂේත්‍රයේ සම්මානලාභී ලේඛකයින් සියයකට ආසන්න පිරිසක් තම නිර්මාණ ඉදිරිපත්කර තිබුණි.

ගෙවීගිය ස්වේච්ඡා බලසේනා ඉතිහාස කතාව තුළ මෙන්ම යුද හමුදා ඉතිහාස කතාව තුළ ද මෙලෙස ජාතික මට්ටමේ සාහිත්‍ය සම්මානයන්ගෙන් පිදුම් ලැබූ එකම ලේඛක සොල්දාදුවා මොහු විමද විශේෂත්වයකි.

හේ නමින් ලා/කෝ සුජීව කුමාර කෝවිලතැන්න වේ. 2(සෙව්) ගැහේබ ඒකකයට අයත් කොනොනියෙකු වන මොහු දැනට ස්වේච්ඡා බළසේනා මුලස්ථානයේ "රණවරුණ" සඟරාවේ විෂයභාර ලිපිකරු ලෙස මෙන්ම එහි විශේෂාංග ලේඛකයෙකු ලෙසද කටයුතු කරයි.

## බුදුදහම තුළින් රෝග නිවාරණය



# මානසික නිරෝගිතාවයෙන් තොර කායික සැපතක් නැත

කර්නල් එම්පීජී පෙරේරා

ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධීකරණ නිලධාරි
(සෙව් කටයුතු) ආසේමු (නැගෙනහිර)

නූතන විද්‍යාව හා තාක්ෂණයේ උපරිම දියුණුවත් සමගම අප ජීවත්වන සමස්ථ ලෝකයම එකම විශ්ව ගම්මානයක් යැයි උදම් ඇනුවත්. එවන් පසුබිමක අහේතුක ප්‍රතිඵල ලෙස මිනිස් ජීවිත අතිශය සංකිර්ණත්වයට පත්ව ඇත. මෙම සංකීර්ණ ජීවන රටාව තුළ දිනෙන් දින උදාවන මානුෂික ගැටළු හමුවේ ඒවා නිරාකරණය කර ගැනීමට නොහැකිවීමෙන් අසරණ වන වර්ථමාන මිනිසා ඛේදජනක ලෙස ජීවන යාත්‍රාවේ අතරමංවී ඇති බවක් පෙනේ. දිවා කාලයේ අපමණ වෙහෙසී රාත්‍රී කාලයේ පවා සැළසුම් සාදමින් වර්ථමාන මිනිසා වෙහෙසෙන්නේ ජීවිතයේ සතුට ලබා ගැනීම උදෙසාය. මෙලෙස දිවා රෑ නොබලා ඇතමුන් සතුට සොයා යනමුත් ලබාගත් සතුටක් නම් පෙනෙන්නට නැත. එබැවින් මිනිසා කොතැනක හෝ වරද්දාගෙන ඇති බවක් පෙනේ. අප ජීවත්වන සමාජයේ බොහෝ මිනිසුන් දෙස බැලීමේදී ඔවුන් තුළින් නිරෝගී පෙනුමක් හෝ අව්‍යාජ නොකැලැල් සිනහවක් දැකිම ඉතා අසීරුය. ඒ වෙනුවට ඔවුන්ගේ මුහුණෙන් දිස්වන්නේ සැමවිටම මොකක්දෝ අවුලකින් පෙලෙන බවයි. ජීවිතය ඔය තරම් පීඩා විඳීමට තරම් සංකීර්ණ දෙයක් නොවන අතර මිනිසා විසින් අනවශ්‍ය ලෙස ජීවිතය සංකීර්ණ කරගෙන ඇත. සැබැවින්ම සතුට සෙවීම සඳහා මෙතරම් වෙහෙසිය යුතුද.?

මෙම සංකීර්ණ තරඟකාරී සමාජයේ අහේතුක ප්‍රතිඵල ලෙස වර්ථමාන මිනිසා බොහෝ මානසික ව්‍යාධින්වලට ගොදුරුවී ඇත. මේවාට හේතු වන මානසික ගැටලු විවිධාකාරය. කුඩා දරුවන් තුළ දක්නට ලැබෙන අධ්‍යාපන දූර්වලතා, හෝ වෙනත් සාමාන්‍ය නොවන මානසික තත්ත්වයන් ළමා

මානසික ගැටලුයැයි හඳුන්වනු ලැබේ. එලෙසම සමාජයේ බහුලව තරුණ මානසික ගැටලුද ඇත. ජීවිතයේ තනිකම, අසහනය, අපචාර, සමාජ බිය, සියදිවි නසාගැනීම, අපරාධ, මත්පැන් හා මත්ද්‍රව්‍යය වලට යොමුවීම, සමලිංගික ක්‍රියා ආදිය ඉන් සමහරකි. විවාහකයන් විෂයෙහිද පවතින පවුල් අඩදබර, අයහපත් ලෙස බිඳුනු පවුල් ජීවිත, දරුවන් අසරණ වීම, මත්පැන් ලෝලීත්වය, අනියම් සම්බන්ධතා, දික්කසාද ආදිය හි අවසාන ප්‍රතිඵලය නොයෙකුත් මානසික ගැටලු ඇතිවීමයි. ජීවිතයේ සැඳෑසමය ගෙවන වැඩිහිටියන් තුළද මානසික රෝග ඇතිවීම උදෙසා තනිකම, අසරණකම, අසහනයෙන් කල් ගෙවීම ආදිය සෘජුවම බලපානු ලැබේ. මෙවැනි තත්ත්වයන් හේතුකොට ගෙන හටගන්නා මානුෂික රෝග බටහිර වෛද්‍ය ක්‍රමයට අනුව හඳුනාගෙන විවිධ මානසික රෝගයන් ලෙස වර්ග කර ඇති අතර, ඉන් සමහරක් පහත පරිදි වේ.

ඉහත දක්වා ඇති පරිදි මිනිසාට වැළඳෙන විවිධාකාර මානසික රෝගී තත්ත්වයන් උදෙසා බටහිර වෛද්‍ය විද්‍යාව අනුව නොයෙකුත් ප්‍රතිකාර ක්‍රම අනුගමනය කරනු ලැබේ. ඒ අනුව හුදෙක් ඖෂධ ප්‍රතිකාර තුළින් පමණක් මෙවැනි මානසික රෝගී තත්ත්වයන් සම්පූර්ණයෙන් සුව කිරීමට හැකියාවක් නොමැත. ඒ සඳහා නින්ද, විවේකය මෙන්ම පුද්ගල ජීවන ආකල්ප වෙනස් කිරීම, ජීවන රටාව හෝ පරිසරය වෙනස් කිරීම, විවිධ තෙරපුම් ක්‍රම, පැවරුම් අභ්‍යාස ආදියද අදාල පරිදි යොදා ගැනේ.

බුදුසමයට අනුව මිනිසුන්ට වැළඳෙන රෝග දෙවර්ගයක් ලෙස බුදුන්වහන්සේ පෙන්වා දී ඇත. එනම් කායික රෝග හා මානසික රෝග වශයෙනි. මිනිසුන්ට කායික රෝග වලින් නොපෙළී කොතරම් කාලයක් ගතකිරීමට හැකිවුවද මානසික රෝග වලින් බේරී සුලු මොහොතක් හෝ ගත කිරීමට අපහසු

| | |
|---|---|
| ආතතිය | Stress |
| උන්මාදය | Mania& |
| විශාදය | Depression |
| කාංසාව | Anxiety |
| කායික රූපී ආබාධ | Somata Form Disorders |
| මත්ද්‍රව්‍යය නිසා ඇතිවන රෝග | Substance related Disorders |
| භින්න උන්මාදය | Schizoiphonia |
| භීතිකා | Phobia |
| ග්‍රස්ථිය | Obsessive compulsive Disorders |
| පශ්චාත් ව්‍යසන ක්ලමථකාරී ආබාධ | Post Traumatic Stress Disorders :PTSD |
| ලිංගික ගැටලු | Sexual Disorders |

බව බුදුන් වහන්සේ අනුදැන වදාරා ඇත. බුදු සමයට අනුව මෙම මානසික රෝග ඇතිවීමට පැහැදිලි හේතුවක්ද පෙන්වාදී තිබේ.

එනම් බොහෝ ලෞකික වස්තූන් කෙරෙහි ආශාවෙන් ඒවා සියල්ල තමන් සතුකර ගැනීමේ අධිෂ්ඨානයෙන් නිරතුරුව උත්සාහයක යෙදී සිටින මිනිසා කොතරම් සැප සම්පත් ලැබුනත් ඒවායින් සෑහීමකට පත් නොවේ. මේවා පසුපස තව තවත් හඹා යාමේදී අත්‍යෘප්තිකර මානසික තත්ත්වයකට පත්වන මිනිසා තුළ ඔහුගේ දෛනික ජීවන රටාවේ විවිධ විකෘති අපිළිවෙලවල් ස්වභාවිකවම මතුවන්නට පටන්ගනී. මේ අනුව වස්තු කාමයන්ට ලොල්වී සැප සොයා යෑම මානසික රෝගී තත්ත්වයක් ලෙසත් එම ක්ලේෂතාපයන්ට ලොල් නොවී නිරාමිස සුවයෙන් කල් ගතකිරීම මානසික නිරෝගීතාවයේ ලක්ෂණයක් ලෙසත්, බුදුසමය පෙන්වා දී තිබේ. මේ අනුව මිනිසා පීඩා විඳින මානසික රෝග සඳහා මූලිකව අප තුළ පවතින නොහික්මුනු රාගාධි ක්ලේෂයන් සෘජුවම බලපාන බව බුදුසමය පෙන්වා දී ඇත. මෙහි සත්‍යතාවය වර්ථමාන සමාජයෙහි පුද්ගලයන් කටයුතු කරන ආකාරය දෙස බැලීමේදී මනාවට පැහැදිලි වේ.

මෙලෙස රාගාධි ක්ලේෂයන් හේතුකොට මිනිසුන් මුහුණපාන මානසික රෝග 44ක් බුදුරදුන් සල්ලේඛ සූත්‍රයෙහි පෙන්වා දී ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ. යම් අයෙකුට මේවා මානසික රෝගී තත්ත්වයන් නොවේයැයි තර්ක කළ හැකිය. එසේ වුවද රහතන් වහන්සේලා හැර සියලු පෘතග්ජන මිනිසුන් උන්මන්තකයෝ ලෙසට බුදුසමය තුළින්ම පෙන්වා දෙන බැවින් පෘතග්ජන මනසින් බැලීමේදී මේවා මානසික රෝගී තත්ත්වයන් නොවන ලෙසට පෙනීයා හැකිය. එහෙත් එය සත්‍ය නොවේ. මානසික රෝග හට ගැනීම සඳහා බලපාන්නේ මිනිසුන් තුළ පවතින රාගාදී ක්ලේෂයන්මය. එබැවින් බුදුසමයට අනුව මානසික රෝගයන් හා ඒවා සමනය කරගත හැකි ක්‍රමයද (ප්‍රතිකාරය) පහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇත.



| රෝගය | ප්‍රතිකාරය |
|---|---|
| අනුන්ට හිංසා කිරීම | අනුන්ට හිංසා නොකිරීම හෙවත් අවිහිංසාව |
| සතුන් මැරීම | සතුන් නොමැරීම |
| අනුන් සතු දේ ගැනීම | අනුන් සතු දේ නොගැනීම |
| කාමයෙහි වරදවා හැසිරීම | කාමයෙහි වරදවා නොහැසිරීම |
| බොරු කීම | ඇත්ත කීම |
| කේලාම් කීම | කේලාම් නොකීම |
| පරුෂ වචන කීම | පරුෂ වචන නොකීම |
| නිශ්ප්‍රයෝජන වචන කීම | නිශ්ප්‍රයෝජන වචන නොකීම |
| අනුන්ගේ දේ ගැන ඇති ආශාව | අනුන්ගේ දේ ගැන ආශා නොකිරීම |
| දූෂිත නරක සිත් ඇති බව | දූෂිත නරක සිත් නැති බව |
| වැරදි සහිත දර්ශණය | නිවැරදි දර්ශණය |
| වැරදි අකුසල සංකල්ප | නිවැරදි කුසල් සිතුම් පැතුම් |
| වැරදි වචන කථා කිරීම | යහපත් වචන කථා කිරීම |
| වැරදි කර්මාන්ත කිරීම | නිවැරදි කර්මාන්ත කිරීම |
| වැරදි ජීවිකාව | නිවැරදි ජීවිකාව |
| වැරදි ව්‍යායාමය | නිවැරදි ව්‍යායාමය |
| වැරදි සිහිය | නිවැරදි සිහිය |
| වැරදි සමාධිය | නිවැරදි සමාධිය |
| නරක ක්‍රියාකොට කලේ හොඳ ක්‍රියා යැයි සිතීම | යහපත් නුවණ ඇති බව |
| වැරදි විමුක්තිය | නිවැරදි විමුක්තිය |
| ථීනමිද්ධයෙන් මඩනා ලද බව | පහවූ ථීනමිද්ධ ඇති බව |
| උඩගු බව | නිහතමානී බව |
| සැක ඇති බව | නිසැක බව |
| කිපෙන සුලු බව | නොකිපෙන සුලු බව |
| බද්ධවෛර ඇති බව | බද්ධවෛර නැති බව |
| ගුණමකු බව | ගුණමකු නොවූ බව |
| යුග ග්‍රාහ ඇති බව | යුග ග්‍රාහ නැති බව |
| ඉර්ෂියාවන්තකම | ඉර්ෂියාවක් නොමැති බව |
| මසුරු බව | මසුරුකමක් නැති බව |
| කෛරාටික බව | කෛරාටික කමක් නැති බව |
| මායා ඇති බව | මායා නැති බව |
| තද බව | තදකම නැති බව |
| මානාධික බව | මාන්නය නැති බව |
| අකීකරු බව | කීකරු බව |
| පාප මිත්‍රයන් ඇති බව | කල්‍යාණ මිත්‍රයන් ඇති බව |
| ප්‍රමාදබව | අප්‍රමාද බව |
| සැදැහැ නැති බව | සැදැහැ ඇති බව |
| ලැජ්ජා නැති බව | ලැජ්ජා ඇති බව |
| පවට බිය නැති බව | පවට බිය ඇති බව |
| ඇසූ පිරූ තැන් නැති බව | ඇසූ පිරූ තැන් ඇති බව |
| කුසීත බව | ආරබ්ධවීර්ය ඇති බව |
| සිහි මුලා බව | සිහි නුවණ ඇති බව |
| මෝඩ බව | නුවණ ඇති බව |
| තම අදහසම දැඩි කොට ගත් බව | තම අදහසම දැඩිකොට නොගත් බව |

බුදු සමයට අනුව සියලුදෙයට සිත ප්‍රධාන වේ. ඉහත සඳහන් කල රෝග 44 හට ගැනීමටද මූලික වන්නේ සිතෙහි ඇතිවන ක්ලේෂ තත්ත්වයන්ය. අපගේ සිත මනාව පිහිටුවා නොගැනීමෙන් සිතෙහි ඇතිවන විෂමකාරී තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහත රෝගයන් හටගන්නා බව බුදුන්වහන්සේ අනු දැන වදාළහ. මෙම මානසික රෝගී තත්ත්වයන් පසුකාලීනව නොයෙකුත් ශාරීරික රෝග ලෙස ඉස්මතුවන බව වර්ථමාන බටහිර වෛද්‍යවරුන්ගේ පවා මතයයි. එසේ වුවද අපගේ සෑම කරුණකටම සිත ප්‍රධානවන බවත් මිනිසාට වැලඳෙන මෙම රෝගී තත්ත්වයන් පිලිබඳවත් බුදුරදුන් විසින් දේශනා කරනු ලැබුවේ මෙයින් වසර 2500 කටත් ඉහතදීය.

සිද්ධාර්ථ කුමාරයා මෙලොව උප්පත්තිය ලැබුවේ දෙවියකු ලෙස නොවේ. අප මෙන්ම මෙම භූමි තලයේ වාතාශ්‍රය හුස්ම ගන්නා සාමාන්‍ය දරුවකු ලෙසය. එසේම රාජකුමාරයකු ලෙසද කටයුතු කලේ අනෙකුත් සමකාලීනයන් සමග සාමාන්‍ය තරුණයෙකු ලෙසයි. එහෙත් මෙලොවෙහි අනිත්‍ය ස්වභාවය පිලිබඳ නිරන්තර අවධානයෙන් පසුවූ සිදුහත් කුමරු සියලු කෙලෙස් ප්‍රහීන කොට බුද්ධත්වයට පත්වූ පසු මිනිසාත් මිනිස් සිතත් පිලිබඳව දැනගත යුතු සියල්ල අවබෝධ කර ගත්තේය.

බුදුන් වහන්සේ මිනිසුන්ට වැලඳුනු බොහෝ ශාරීරික හා මානසික රෝගී තත්ත්වයන්ට ප්‍රතිකාර කර ඇති බව බුදුසමය පෙන්වා දෙයි. කිසාගෝතමී, අංගුලිමාල වැනි තදබල ලෙස මානසික රෝගී තත්ත්වයන්ගෙන් පෙලුණු අයවලුන් සඳහා ප්‍රතිකාර ලබාදී සුමගට යොමුකරනු ලැබුවේ අතිදක්ෂ මානසික වෛද්‍යවරයෙකු ලෙසයි. මෙවැනි අවස්ථා බුද්ධ චරිතයේ ඕනෑ තරම් සොයා ගැනීමට ඇත. බෞද්ධ සම්ප්‍රදාය තුළ බුදුන් වහන්සේ හඳුන්වා ඇත්තේ කායික හා මානසික රෝග පිලිබඳ ශ්‍රේෂ්ඨතම වෛද්‍යවරයා ලෙසයි. මක්නිසාදයත් සියලු රෝග වලට උපත වන සසර දුකට උන් වහන්සේ ඖෂධ නියම කරන නිසාය.

බෞද්ධයින් වශයෙන් අපට ඇති ලොකුම සතුට ප්‍රීතිය සැනසීම හා ආඩම්බරය වන්නේ අප අදහන ශාස්තෘවරයා ඉතිහාසයක් නැති දෙවියකු නොවී ඉතිහාසයක් ඇති උත්තරීතර මනුශ්‍යයකු වීමයි.

(ලබන කලාපය හා සම්බන්ධයි)

# කවි මල් යාය



**සෙනෙහස අපේ**

වළාකුළ ඔබ
පවන් රොද මා
ඈත අහසේ
පාවෙනා...

රෝස මලයි නුඹ
දුර උයන් තෙර
තනිව ලෙලදෙනා
සමනලයෙකි මා
ඔබ සිප ගන්නට
නොහැකිව ළතවෙන

සුමුදු සඳ ඔබ
පුංචි තරුව මම
ඈත අඳුරු ගුවන් ගැබේ
ලං වන්නට බැරි වෙලා

**කර්නල් එම්ජීඑන්බී මහතුවක්කාර**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
කර්නල් ප්‍රමානි ශ්‍රීලංයුහසෙව්බමු

**සුසුම් සර**

නෙතු අග කඳුලක් ...
නිල් අහස් කුස හත්දින්නත් තරු අතර
වලාකුලු තුළ සැඟවිලා
එකම ඉර හඳ යට වුවත් අප
වෙනම ලෝකෙක තනිවෙලා

වෙනස් වෙන්නෙ නැති පෙමක් සෙව්වත්
ආදරේ මඟ නැවතිලා
යලිත් එන්නෙ නැති බවත් දනගෙන
තවම ඇස් මඟ බලනවා

දුස් කඳුලින් තෙමී තිබුණත්
තවම ඔබෙ රුව සොයනවා
මගේ නොවුනත් නුබෙ සිත ලඟ
සුසුම් හෙලමින් ඉදිමි මා

කවුරු ගැනවත් නොදනුනත් මට
පෙමක් නුබ ගැන දනෙනවා
හැබෑ නොවෙනා හීනයක් ලඟ
නුබෙ නමට කවි ලියනවා..

**මේජර් ආර් පී ආර් ගමගේ**
ප්‍රමානි II ක්‍රියා ශ්‍රීලංයුහසෙව්බමු

# බරසාර පුහුණුවක අභිමානය



## 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව

18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු වැඩබලන අණදෙන නිලධාරි මේජර් එම්පීඩී ප්‍රේමවංශ ආර්එස්පී ගේ නායකත්වය යටතේ එම ඒකකය සිය බළඇණි පුහුණුව මඩකළපුව පූනානි හි ස්ථාපිත 23 සේනාංක බලඇණි පුහුණු පාසල වෙතින් සාර්ථකව හදාරන ලදී.



## 12 විජයබාහු පාබල රෙජිමේන්තුව

12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව සිය බලඇණි පුහුණුව වෙත්තලයිකේනි හි ස්ථාපිත 55 සේනාංක බලඇණි පුහුණු පාසල වෙතින් සාර්ථකව හදාරන ලදී. නිලධාරි 10ක් හා සෙසු නිළයින් 325ක් සහභාගී වූ එම පාඨමාලවේ දක්ෂතම සිසුවාට, වෙඩික්කරුට හිමි සම්මානය සෙ/එච්100540 සාසෙ මදුෂාන් එච්එච්එස් හිමිකර ගන්නා ලදී. දක්ෂතම කණ්ඩායමට හිමි සම්මානය 12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තු "සී" කණ්ඩායමට හිමිවූහ.



## 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු

ත්‍රිකුණාමලය මූතූර් ප්‍රදේශයේ ස්ථානගත 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව පසුගියදා සිය 04 වන බළඇණි පුහුණු පාඨමාලාව තාවුල්වැව බළඇණි පුහුණු පාසලේදි හදාරන ලදි. මෙම පඨමාලාව සඳහා ඒකක සාමාජිකයෝ වැඩ බලන අණදෙන නිලධාරි මේජර් එම්ඒසීපී මාරසිංහ ශ්‍රීලංජාආබමු ගේ අණදීම යටතේ සහභාගී වුහ.

# සැබෑ වූ සිහිනයේ සුන්දර මතකය



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ 16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් **සෙ/එච්101827 සාසෙ ප්‍රියංකර ජීජීඑස් හා ඒපී හර්ෂනි ධර්මසිරි මෙනවිය.**



පසුගියදා යුග දිවි ගමන් ඇරඹූ 16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් **සෙ/එච්102016 සාසෙ සම්පත් කේපීඑච් හා වයිඒ නිලක්ෂි මධුෂානි මෙනවිය.**



පසුගියදා යුග දිවි ගමන් ඇරඹූ 12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් **සෙ/12එච්01652 සාසෙ පෙරේරා එම්ටීඩීඒ සහ ශ්‍රීමාලි මෙනවිය**



පසුගියදා යුග දිවි ගමන් ඇරඹූ 9 ශ්‍රීලංජාආබමු ඒකකයට අයත් **සෙ/9කියු02413 කෝප්‍රල් නන්දසේන ඒඒ හා ඉනෝකා ප්‍රියදර්ශනි මෙනවිය**

# HAPPY BIRTHDAY



පසුගියදා දෙවන වියට පාතැබූ
**ඒ. ඩී. ඕසඳ මිහිසර කුමාරසේන පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම..
සෙ/එච්100480
කෝප්‍රල් කුමාරසේන ඒඩීඑස්යු



පසුගියදා දෙවන වියට පාතැබූ
**ඉත්මා ෂලෝමි විජේකෝන් දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම..
සෙ/කිව්01663
කෝප්‍රල් විජේකෝන් ඩබ්එම්කේපී



පසුගියදා දෙවන වියට පාතැබූ
**පමිතු පසන් කවීශර සිඟිති පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම..
සෙ/105234
ලා/කෝ වීරසිංහ ඊඑච්එම්



පසුගියදා දෙවන වියට පාතැබූ
**විනුදි යෙතුම්සා සිඟිති දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම..
සෙ/කිව්01554
ලා/කෝප්‍රල් ධර්මසේන එස්යු



පසුගියදා අටවන වියට පාතැබූ
**එන්.එස් දිලංග හෙට්ටිආරච්චි පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම..
සෙ/5කිව්02109
සාසෙ හෙට්ටිආරච්චි එච්එම්



පසුගියදා හයවන වියට පාතැබූ
**තිනුර තරින්ද උදලිත පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/3ආර්01361
කෝප්‍රල් හේමාලි කේසීසී



පසුගියදා නවවන වියට පාතැබූ
**එම්. පී. දුමිඳු කවිෂාන් ප්‍රියංකර පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම..
සෙ/5ඒ 02411
සැරයන් පියන්කර එම්පී



පසුගියදා අටවන වියට පාතැබූ
**වගීෂ නිම්සර පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
පවුලේ සැම..
සෙ/9කිව්01920
බනි II සුසිරිපාල ඩබ්ලිව්ඩබ්ලිව්එම්



පසුගියදා හත්වන වියට පාතැබූ
**සෞභාග්‍යා මෙත්සඳිනි කාන්ගර දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම..
නි/6539
කපිතන් කේඑම්එස්බී කාන්ගර

# HAPPY BIRTHDAY



පළමු වියට පාතබන
**සඳමිණි ඕනක්ෂි යාපා දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
නි/6198 මේජර් වයිඑම්ජ්බී යාපා ශ්‍රීලංසිරෙ



දෙවන වියට පාතබන
**පී. එල්. අනුම් බිහංසා දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/එච්100250 සාසෙ කුමාර පීඑල්ආර්එන්



පළමු වියට පාතබන
**තිසුම් අනන්‍යා සිව්‍යාංජලී සෙනෙවිරත්න දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
අආදරණිය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම...
සෙ/එච්101104 සාසෙ සෙනෙවිරත්න
ආර්එම්ආර්ජ්



එකළොස්වන වියට පාතැබූ
**ජේ. ඒ. නිම්නි නිහාර දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/එච්00608 ලා/කෝ ජයසේකර ජේජ්එස්



අටවන වියට පාතබන
**කේ. ඒ. සසනි කවීෂා අධිකාරි දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00259 සැරයන් රවීන්ද්‍ර රත්න කේඑන්



දොළොස් වන වියට පාතැබූ
**ආර්. එම්. කවීෂා නිර්මාණි රත්නායක දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
එෆ්15097 සිවිල් සේවක ආර්එම් අබේකෝන්
බණ්ඩා



හතර වන වියට පාතැබූ
**ටී. බී. ඉමේෂ් මාදව පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00374 ලා/කෝ ඉලංගරත්න ටීබී.



පළමු වියට පාතැබූ
**ඒ. උෂාන් හසරැල් අමරසිංහ**
පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00676 සාසෙ අමරසිංහ ඒපීඑස්.



හයවන වියට පාතැබූ
**ඒ. වොෂාන් චලන අමරසිංහ පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණිය අම්මා තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00676 සාසෙ අමරසිංහ ඒපීඑස්.

# HAPPY BIRTHDAY



පසුගියදා පළමු වියට පාතැබූ
**එන්. දැහැමි සෙහාරා පහන්දි දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුලු
පවුලේ සැම...
සෙ/2ආර් 02651 කෝප්‍රල් වීරසිංහ
අයිඩීඩීඑන්



පසුගියදා පළමු වියට පාතැබූ
**සනිකි දහම්සා කුමාරසිරි දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුලු
පවුලේ සැම...
සෙ/106638 ලා/කෝ කුමාරසිරි පීපීඑස්ආර්



හයවන වියට පාතබන
**චතුමි කෞෂල්‍යා දියණියට**
සුභ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා
ඇතුලු පවුලේ සැම...
සෙ/ඩී100643 සාසෙ ප්‍රේමරත්න පීපීපීඑස්



පසුගියදා තුන්වන වියට පාතැබූ
**එම්. ලක්දුනි අමාශා වීරසේකර දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුලු
පවුලේ සැම...
සෙ/එච්100431 සාසැ
වීරසේකර එම්එස්එස්



පසුගියදා සිව්වන වියට පාතැබූ
ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර පදිංචි
**යුනෙලි ශෙනර්යා වීරතුංග දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා සහ යුද හමුදාවේ තාත්තා
ඇතුලු පවුලේ සැම...



පසුගියදා හයවන වියට පාතැබූ
**එස්. ආර්. පී. ලසිත සූරියආරච්චි**
පුතුට සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා තාත්තා ඇතුලු
පවුලේ සැම
සෙ/20එච්00457 සාසෙ නිශාන්ත එස්ජ්යූ



පසුගියදා පළමු වියට පාතැබූ
**එම් ඒ ඔවින්දි දම්සරා මල්ලිකාආරච්චි දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුලු
පවුලේ සැම...
සෙ/3ආර්02105 ලා/කෝ
රත්නසේන කේයූඩීඑස්



දෙවන වියට පාතැබූ
**කේ. පී සඳිසී රශ්මිකා කුලරත්න දියණියට**
සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා තාත්තා ඇතුලු
පවුලේ සැම
සෙ/5ජ්00140 බනි I කේපී කුලරත්න



පසුගියදා සිව්වන වියට පාතැබූ
**සනිදු නිහංස පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තත්තා ඇතුලු පවුලේ
සැම...
සෙ/ඕ100120 ලා/කෝ අමරවංශ ආර්ජීඑන්

# ඒකක විත්ති

## 5 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු



212 බළසේනාවේ බළසේනාධිපති එම්පී ළමාහේවා යූඑස්පී පසුගියදා සෙත්සිරිගම තන්තිරිමලය ප්‍රදේශයේ ස්ථානගත 5 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුවේ නිරීක්ෂණ චරිකාවක නිරත විය.

## 8 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු



232 බළසේනවේ බළසේනාධිපති කර්නල් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී පසුගියදා තොප්පිගල පෙරියවඩ්ඩුවාන් ප්‍රදේශයේ ස්ථාන ගත 8 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නිරීක්ෂණ චාරිකාව නිරත වු අයුරු...

## 20 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු



55 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී පසුගියදා 20 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහිදි ඒකකයේ නව මුරහල විවෘත කිරීම සේනාංකාධිපති විසින් එදින සිදුකරන ලදි.

## ආසේමු (බටහිර) ස්වේච්ඡා ඒකක



ආරක්ෂක සේනා මුලස්ථාන (බටහිර) කර්නල් සම්බන්ධීකරණ නිලධාරි කර්නල් එම්එච්එම්එල්එස්කේ වීරසේකර පසුගියදා 3(සෙව්) ගැහේබ, 6, 7, 8, ඉසේරෙ, 2ශ්‍රීලයුපොදුසේබ, 5 ශ්‍රීලයුපොදුසේබ, හා රෙජිමේන්තු මුලස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව යන ස්ථානයන්හි පාලන පරික්ෂවක නිරත විය.

## 17 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



17 වන බලඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව සිය 21 වන සංවත්සරය පසුගියදා ඒකක මුලස්ථානය ස්ථාපිත පදවි පරාක්‍රමපුර දී වැ: බ: අණදෙන නිලධාරි මේජර් ඩීආර් තාරුකාරත්න ශ්‍රීලංජාආබමු ගේ ප්‍රධානත්වයෙන් සමරන ලදී.

## 2(සෙව්) ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බලකාය



දශක නවයකට එහාගිය ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන 2 (සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකාය සිය 99 වන සංවත්සරය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඩීජ් ක්‍රිෂාන්ත ශ්‍රීලයුසේබ ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා අභිමානවත් අයුරින් සමරන ලදී.

# කෙළිබිමේ විත්ති



පසුගිය දා සඳුන්පුර මහවැලි ක්‍රීඩාංගනයේ දි විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නිත්‍ය හා ස්වේච්ඡා ඒකක 14 සහභාගීත්වයෙන් පැවති එල්ලේ තරඟාවලියේ දී 3(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තු කණ්ඩායම ශූරතාවය දිනා ගැනීමට සමත් වූහ. එම අවස්ථාවට ප්‍රධාන ආරධිත අමුත්තා ලෙස 242 බළසේනාවේ බළසේනාධිපති කර්නල් යූපීආර් වීරකොන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී විය.



22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීජ් ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ මගපෙන්වීම මත 2017.09.02 වන දින 22 සේමු ක්‍රීඩාංගනයේදී පාපන්දු තරඟයක් පවත්වන ලදී. මෙම තරඟය සඳහා 22 සේනාංක පාපන්දු කණ්ඩායම හා ත්‍රිකුණාමල දෙමළ පාපන්දු ක්‍රීඩා සමාජ කණ්ඩායම් සහභාගී වූහ. ජාතින් අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති කිරීමත් යුද හමුදාව හා සිවිල් ජනයා අතර, සුහදත්වය වර්ධනය කිරීමත් මෙම තරඟාවලියේ අරමුණ විය.



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙතින් බිහිවී කෙළබිම ජයගත් එම රෙජිමේන්තුවට අයත් ක්‍රීඩකයින් සඳහා වර්ණ ප්‍රදානය කිරීම පසුගියදා කුරුණෑගල වයඹ පළාත් සභා ශ්‍රවණාගාරයේදි පැවැත්විණ. එහිදි වර්ණ ලාභී ක්‍රීඩකයින් අතර, 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් ක්‍රීඩකයෝ කිහිපදෙනෙක් ද වූහ. තම රෙජිමේන්තුවේ නාමය ද. තම ඒකකයේ නාමය ද කෙළිබිම තුළ ඔසවා තැබීමට දහඩිය වැගිරූ එම 18 ශ්‍රීලංජාආබමු වර්ණ ලාභි ක්‍රීඩකයින් ඒකක අණදෙන නිලධාරි සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු...



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) විසින් සංවිධානය කරන ලද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් පසුගියදා ආසේමු (නැ) ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. ඒකක 27ක් තරඟ වැදුනු මෙම තරඟාවලියේ අනුශූරතාවය 3(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවට හිමිවිය. අවසන් මහා තරඟයේ ප්‍රධාන ආරධිත අමුත්තා ලෙස ඇසේමු (නැ) කර්නල් සම්බන්ධීකරන නිලධාරි (සෙව්) කර්නල් එම්පීපී පෙරේරා සහභාගී විය. ඇසේමු (නැ) කර්නල් පාලන/හකාස කර්නල් ඒඅයිටී කුරුවිට ඇතුලු යුද හමුවේ ජ්‍යෂ්ඨ නිලධාරීහූ රැසක ද සෙසුනිලයෝ රැසක්ද මෙම අවස්ථාවට එක්වූහ.



57 වන සේනානංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පිඑස්පී ගේ සංකල්පයක් මත එම සේනාංකයට අයත් බළඇණි අතර පවත්වන ලද මැරතන් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීමට 16 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායම සමත් වූහ. ජයග්‍රාහීන් වෙත පදක්කම් හා සහතිකපත්‍ර ප්‍රදානය කිරිම ආරක්ෂ සේනා මූලස්ථානය කිළිනොච්චි ආඥාපති මේජර් ජෙනරාල් ඒ කාරියකරවන ආර්එස්පී එන්ඩිසී විසින් සිදුකරන ලදී.

# විශිෂ්ටයන් අතර විශිෂ්ටයෙකු වී



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) අධීක්ෂණය යටතේ පසුගියදා පැවත්වූ විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලාව හැදෑරූ 10 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් නි/10848 2/ලුතිනන් ඩීඑම්ජී රණසිංහ පාඨමාලාවේ දක්ෂතම වෙඩික්කරුට හිමි කුසලානය දිනා ගැනීමට සමත් විය. ඒකක 35කට අයත් නිලධාරීහු 18ක් හා සෙසු නිළයෝ 302ක් මේ සඳහා සහභාගී වූහ.



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) වෙතින් තෙවන වරටත් පැවැත් වූ නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟාවලියේ සිව්වන ස්ථානය 15(සේව) ගැමුණු හේවා බළකායට අයත් සෙ/15එෆ්00740 ලා/කෝප්‍රල් ජයතිලක යූපීඩබ්ලිව්එම්බීඩී හිමිකර ගැනීමට සමත් විය. ඒ ඔහු විසින් ඉදිරිපත් කරන ලද දුරකතන භාවිතා කිරීම තහනම් ස්ථානවලදී එය සංඥාවක් මගින් දැනුම් දීම සඳහා නිපයූ නව නිර්මාණයටය.



යුද හමුදා ස්වේච්ඡා පුහුණු පාසල දියතලාව වෙතින් පැවත්වනු ලැබූ "කාර්යාල පරිපාලන සහායක පාඨමාල අංක 80" හැදෑරූ 2(සේව) ශ්‍රීලයුපොදුසේබ ඒකකයට අයත් සෙ/ඕ100096 ලා/කෝප්‍රල්පතිරාජ එච්පීඩීඅයිඩී "ඒ" සමාර්ථයක් ලබමින් පාඨමාලාවේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් වී ඇත. මෙම පාඨමාලාව සඳහා සෙනිහු 38 ක් සහභාගී වූහ



වත්තල පිහිටි රණවිරු සම්පත් කේන්ද්‍රය හා වෘත්තිය පුහුණු අධිකාරිය සමග ඒකාබද්ධව පවත්වනු ලැබූ පරිගණක මෘදුකාංග පාඨමාලාව හැදෑරූ 3(සේව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් සෙ/ඊ100086 රසෙ කුමාර එම්ඩබ්ලිව්ජී එම පාඨමාලාවේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනිමට සමත් විය. මෙම පාඨමාලාව සඳහා සෙනිහු 135 දෙනෙකු සහභාගී වූහ.




ස්වේච්ඡා පුහුණු පාසල (දියතලාව) වෙතින් පැවැත්වූ ඉංග්‍රිසි භාෂා පාඨමාල අංක 27 හැදෑරූ 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙ/කියු110375 සාසෙ කුමාර ආර්එම්එන්ජ් එහි ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී.



2017 දීප ව්‍යාප්ත සහසක් නිපැයුම් තරඟාවලිය සඳහා යුද හමුදාව නියෝජනය කළ 9 ශ්‍රීලංජාආබමු ඒකකයට අයත් සෙ/කියු109572 බනි II නලීන් කුමාර පීඩීඑන් ජෙයකොනොනි විසින් ඉදිරිපත් කරන ලද ඉඳිආප්ප සැකසුම් යන්ත්‍රය සඳහා දීප ව්‍යාප්ත සිවිල්/ යුද හමුදා නිර්මාණ අතුරින් ආහාර තාක්ෂණ අංශයෙන් ප්‍රථම ස්ථානය ලැබ රන් පදක්කමක්, හිමිවිය.



6 (සේව) ශ්‍රී ලංකා බුද්ධි බලකායට අයත් නි/6441 මේජර් එච්ඩබ්ලිව්ඩබ්ලිව් රණසිංහ සබුබ බටලන්ද පිහිටි ආරක්ෂක අණ හා මාණ්ඩලික විද්‍යාලය මගින් පවත් වන ලද පාඨමාලා අංක 10 හදාරා "බී" ශ්‍රේණියේ සමාර්ථයක් ලබාග ැනීමට සමත්ව තිබේ.



ප්‍රථම ස්ථානය
**සෙ/19කියු00605**
**මා/සැරයන්**
**වීරසේන එම්පීඑස්**



දෙවන ස්ථානය
**සෙ/එච්101355**
**සාසෙ සේනානායක**
**එස්එම්එස්බී**



තෙවන ස්ථානය
**සෙ/ඩී100713**
**සාසෙ බොතේජු**
**පීඩබ්බීඩබ්**

දියතලාව ස්වේච්ඡා පුහුණු පාසල වෙතින් 2017.09.01 දින සිට 2017.10.07 දින දක්වා පැවැත්වූ රෙජිමේන්තු ගිණුම්කරණ පාඨමාලා අංක 17 සාර්ථකව හැදූරූ ඉහත ශායාරූපයන්හි දැක්වෙන අයවලුන් එහි ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන පිළිවෙලින් දිනාගන්නා ලදි. මෙම පාඨමාලාව සඳහා සිසුන් 28 දෙනෙකු සහභාගී වූහ.



# ආලින්දය ගිනිගනී

සුපුරුදු වේලාවට එදිනද වැඩ අවසන් වුවද වර්ෂාව හේතුවෙන් නිවසට යන විට වෙනදාට වඩා බෙහෙවින් ප්‍රමාද වී තිබිණ. කෙසේ හෝ නිවසට ඇතුල්වන විට වැස්ස තුරන් වී තිබූ අතර ගෙතුලින් මට ඇසුනේ කිහිපදෙනකු බොහෝ හැගුම්බර විලාසයෙන් කතාබහ කරන අයුරුය. මා කඩිමුඩියේ සාලයට දිව ආවේ කාට හෝ කිසියම් කරදරයක් දෝයි යන සැකයෙනි. එවිට මා දුටුවේ නිවසේ පුටු සෙටියේ බිරිඳ හා දරු දෙදෙනා වාඩි වී කතාබස් කරන අයුරුය. බිරිඳ බොහෝ සෙයින් කම්පා වී ඇති සෙයකි. දියණියගේ මුහුණද මැලවී ඇත. පුතා ඉහිලුම් නොදෙන කෝපයෙන් වෙව්ලනු පෙනේ. මම කිසිවක් නොදොඩා කාමරයට වැදී ඇඳුම් මාරුකරන අතරේ ඔවුන්ගේ කථාවට කන් යොමු කලෙමි.

"අපරාදෙ චේතනාට තිබුනේ ඇත්ත කියන්න." බිරිඳ ගයානි කීවාය.

"එහෙම බැනෙ අම්මේ, ඇත්ත කිව්වනම් මේනක එයාට ගහනවනෙ." දුව කීවාය.

"අනේ අම්මේ මට ඕකා අහුඋනානම් මරනව. චේතනා අක්කට ඔය තරම් අසාධාරණ වැඩ කරනවට." පුතා දත් මිටි කමින් කීවේය.

අද මොනව වෙයිද දන්නෙ නෑ නේද අම්මේ. දුව නැවතත් හඬ අවදි කළාය.

එම කෙටි පිළිසඳර කනවැකෙත්ම එය කුමක් අරඹයාද යන්න මට තේරුම් ගැනීම අපහසු නොවුණි. ජාතික වශයෙන් අද රටෙහි කොතරම් ප්‍රශ්න වෙතිද? ඒවා වැඩිහිටියන්ට පමණක් නොව දූ දරුවන්ට පවා සෘජුවම බලපාන ඒවාය. ඒ ඇරුණුවිට පුද්ගලික ජීවිත තුළද එදිනෙදා නිවසේ වැඩ කටයුතු වලදීද මොනතරම් ගැටළු මතුවිද? නමුත් රූපවාහිනීයට ඇබ්බැහිවූ බහුතරයක් සිදුකරනුයේ නලු නිළියන් ටෙලි නාට්‍ය වල බොරුවට රඟ දක්වන සිදුවීම් ඇත්තක් සේ තම ජීවිත වලට ඇඳාගෙන වද විඳීමය. සමස්ථ රටේම ජනවිඥානය රූපවාහිනී නාලිකා වල හිමිකරුවන්ගේ රුචි අරුචිකම් අනුව මෙහෙයවන තත්වයට අද සෑම නිවසක්ම පත්ව තිබේ. දේශීය මෙන්ම හඬ කවන විදේශිය මෙගා ටෙලිනාට්‍ය රැල්ලක්ද සෑම නිවසකම බහුතර කාන්තාවන් හා දරුවන්ගේ ගෙල සිරකොට ඇති සෙයකි. එවැනි ටෙලි නාට්‍යවල සුලබව දැකිය හැකි ප්‍රාථමික ගති ලක්ෂණ මැන බැලීම මෙහි අරමුණයි.

## තනි පෙළට හිඳ කථා කිරීම.

බොහොමයක් මෙගා ටෙලි නාට්‍ය වල එකිනෙකා කතාබස් කරනුයේ උනුන්ගේ මුහුණු බලාගෙන නොව තනිපෙළට හිටගෙන කැමරාව දෙස බලාගෙනය. දෙදෙනෙකු කතා බස් කළද සමූහයක් කතා බස් කලද එම තත්වය පැහැදිලිව දැකගත හැකිය.

## උතුර දකුණ හඬකැවීම.

බොහෝ හඬකවන විදේශීය ටෙලි නාට්‍ය වල දෙබස් අසන විට පාසල් ළමුන් සිදුකරන "කියවන විට ලිවීම" වැනිය. දෙබස් වලින් උතුර කියන විට කට හොල්ලන්නේ දකුණටය කෘත්‍රිම දෙබස් එම චරිත වලට බලෙට ආරූඪ කරවන බව පැහැදිලිව පෙනේ. ඒවා එතරම්ම අතාත්වීකය. ඒ කෙසේ වෙතත් කෙළ ගිලින්නේවත් නැතිව ඇසිපිය ගසන්නේවත් නැතිව අකුරක් නෑර ඒවා අසා සිටින ප්‍රේක්ෂයෝ ද අඩු නැත.

බොහෝ මෙගා ටෙලි නාට්‍ය වල මුල මැද අග නොමැත සිදුවනුයේ එදා වේල පවත්වාගෙන යාම පමණි. එවැනි ටෙලිනාට්‍ය වල ඉදිරියේදී සිදුවන්නේ කුමක්දැයි අධ්‍යක්ෂවරයාවත් නොදනී. 5 වසරේදී අරඹන ටෙලිනාට්‍ය ඇතැම් විට ඔහු හෝ ඇය අපොස සාමාන්‍ය පෙළ ලියන තෙක්ම විකාශය වේ. ඇතැම් නාට්‍ය ඒ තරම් දිගය.

සමහර ටෙලිනාට්‍ය දිගහැරෙනුයේ "යන්නෙ කොහෙද මල්ලෙ පොල්" ආකාරයටය. ආරම්භයේදී කිසියම් තේමාවකට කලාත්මකව ගලාගෙන යන නාට්‍ය ජනප්‍රියත්වය වැඩිවත්ම එහි ගමන් මග වෙනස් කොට කලාව පසෙක දමා වෙළඳ පරමාර්ථයට හරවයි. එහිදී කතාවේ මුල සිට සතුරෙක් ලෙස පෙන්වූ චරිතය පසුව මිතුරෙක් කරවයි. එසේ නොමැතිනම් මිතුරා සතුරු කරවයි. කිසිදු ගැළපිල්ලක් අදාලත්වයක් නැති චරිත එක් වරම කතාව තුළට රිංගවයි. ඇඟුනුම් කමක් ඇත්නම් ඕනෑම අයෙකුට තේමාව කුමක් වුවත් එවැනි නාට්‍යවල කුමන හෝ චරිතයක් ඉල්ලා ගතහැකි වන තරමට කතාව බාල කරයි.

ජනප්‍රියත්වය වැඩි වත්ම ඕනෑම කතාවක් දිගට ඇදගෙන යන්නේ ඒ අයුරිනි.

### වෙළෙඳ දැන්වීම්.

වෙළෙඳ දැන්වීම් යනු විද්‍යුත් මාධ්‍ය ආයතනයක තීරණාත්මක සාධකයකි. එනිසා නාළිකා පැත්තෙන් එය බැහැර කල නොහැක. නමුත් ප්‍රේක්ෂකයින් පැත්තෙන් එය මහා වදයකි. ටෙලි නාට්‍යයක් තුළ ඇරඹුමේදි මැදදි අගදී වශයෙන් අවස්ථා ගණනාවකදී එක දිගට වෙළද දැන්වීම් විකාශය වේ. ඇතැම් විට ටෙලි නාට්‍යයක් විකාශනය වන අතරතුර අතරින් පතර වෙළද දැන්වීම් ප්‍රචාරය වන්නේද නොඑසේනම් අඛණ්ඩව වෙළඳ දැන්වීම් පමණක් විකාශය වන වැඩසටහනක් තුළ අතරින් පතර ටෙලිනාට්‍යයක කොටස් විකාශය වන්නේද දැයි සිතාගත නොහැක.

### පාසල් නිළඇදුමින් රඟපෑම.

ඇතැම් නාට්‍යවල ප්‍රධාන චරිත සියල්ලෙහිම පාසල් ළමයින් සිටිනු පෙනේ. කතාව ආරම්භයේ සිට අවසානය තෙක්ම පෙන්වන්නේ ඔවුන් පාසල් නිළඇදුමින් පෙම් කරන අයුරුය. නොඑසේනම් පාසල් ඇදුමින් ගහබැන ගන්නා අයරුය. නිවසේ දර්ශන වලද පෙන්වනුයේ තම පෙම්වතාට හෝ පෙම්වතියට දුරකථන ඇමතුම් ගන්නා අයුරුය. අම්මා තාත්තාද දරුවන්ගේ එම පෙම් හබවලට අතරමැදියන් වී ඇති සෙයකි. සමස්ථයක් ලෙස එම කතා වල ඇරඹුමේ සිට අවසානය දක්වාම පාසල් ළමයින් "ඉගෙන ගැනීම හැර" අන් සියලුම දේ සිදුකරන අයුරු පෙන්වයි. නිවසට වී තම දෙමාපියන් හා දරුවන් එම කතා එකට සිට නරඹන අවස්ථා වලදී දරුවන් දෙමාපියන් දෙසත් දෙමාපියන් දරුවන් දෙසත් හොරැහින් බලන අයුරු දැකගත හැකිය.

### සිත නිවන කථා

වත්මන් ටෙලිනාට්‍ය බහුතරයක ඇත්තේ කුමන්ත්‍රණ, වෛරය, පලිගැනිම, විරහව පමණි. කතාව ආරම්භයේ පටන්ම පෙම්වතිය උස්සාගෙන යන්නට කට්ටියක් අර අඳිති. තවත් පිරිසක් පෙම්වතාට පහර දේ. බිරිඳ සැමියා හැර ගොස්ය, නැත්නම් සැමියා බිරිඳ හැර ගොස්ය. පියාගේ පාර්ශවය ධන කුවේරයෝය. නැත්නම් මව් පාර්ශවය ධනපතියන්ය. පිටරට සිටින පුතාට හෝ දුවට ලංකාවේ සිටින දෙමාපියෝ මගුල් තීන්දුකර අවසන්ය. නමුත් පුතාගේ හෝ දුවගේ හිත ඇත්තේ වෙන කෙනෙකුටය. මේ සුලභව ටෙලිනාට්‍යවල දැකිය හැකි තත්වයකි. පොලවේ පයගසා යන ගැමි සුන්දරත්වය පිරි සාමාන්‍ය ජන ජීවිතය අලලා දිගහැරෙන ටෙලි නාට්‍ය ඇත්තේ කලාතුරකිනි. බොහෝ ටෙලි නාට්‍ය වල ඇත්තේ මාලිගා වැනි ගෙවල් අයිතිකරුවන්ය. හැමෝම යන්නේ බෙන්ස්, ප්‍රාඩෝ වලය. කෝටිපති ව්‍යාපාරික තාත්තලා බොහෝ කතාවල අඩුනැත.

එක්තරා දිනක මා ප්‍රියා බිරිඳ රාත්‍රී 10 වන විටත් රූපවාහිනිය අසල රැඳෙමින් එහි ඇති නාට්‍යයන් නරඹමින් සිටියාය.

ඇයි ඔයා අද නිදාගන්නේ නැද්ද ? හෙට උදේම පුතාලගේ ඉස්කෝලෙටත් යන්න තියෙනව කිව්ව නේද ? අනික මේ රෑට රෑ වේලා ඕව බලන්න ඕනෙද ? වැරදීමකින් මා හට කියවිණ.

"උදේ ඉඳන් කලේ උයන එකමයි. රෙදි කප්පරක් හේදුවා. ඔයාගෙයි ළමයිගෙයි ඇඳුම් මැද්ද, ගෙවල් දොරවල් අස්පස් කළා. සේරම කරලා නැහිලා නැහිලා පොඩ්ඩක් සැහැල්ලුවෙන් ටිවී එක බලන්න ගත්තාම ඔයා ඒකටත් නෝක්කාඩු කියනවා." ඇය මහා දෝස්මුරයක් නැගුවාය. මම නිහඬව එය අනුමත කරමින් ඇය බලන ටෙලිනාට්‍ය දෙස මොහොතක් බලාසිටියේය. එහි ඇත්තේ එකම කාලගෝට්ටියකි. බිරිඳ හා සැමියෙකු අතර මහා පටලැවිල්ලකි. ඒ අතර ප්‍රේමයෙන් පරාදවූ දියණියකගේ ඉකිගැසීමකි. එය බලාසිටි විනාඩි කිහිපය තුළ මාගේ ඔලුවද කරකැවෙන්නට විය. බිරිඳ කියූ පරිදි දවස තිස්සේ ගෙදර බැල මෙහෙවර කර අවසානයේ නින්දට යන මොහොතේ සැහැල්ලුවෙන් හිඳ බලන්නේ එවැනි ටෙලිනාට්‍ය නම් ඇය කෙසේ නිදා ගන්නේ දැයි මට සිතා ගැනිමට නොහැකි විය.

"ඕක පොඩ්ඩක් අඩු කරන්න. අහල පහළ මිනිස්සු හිතාවි අපි දෙන්නා රණ්ඩු වෙනව කියලා. එහෙම නැත්නම් හිතයි කවුරු හරි මැරිල කියල." මම ඇය හමුවේ බැගැපත් වී යාන්තම් රූපවාහිනිය අඩුකර නින්දට ගියේය.

### අතපසුවන කොටස් නැවත නැරඹීම.

මීට කලකට ඉහතදී එක් ටෙලිනාට්‍යයක් රූපවාහිනියේ විකාශය කෙරෙනුයේ සතියකට වරකි. නමුත් සතියකදී එක් වරක් ප්‍රචාරය කෙරෙන එම ටෙලිනාට්‍යක් ගැන වුවද සතිය පුරාම කතාකරන්නට යමක් ඉතුරු වේ. නමුත් වර්ථමානයේ ටෙලි නාට්‍ය කලාව ඊට හාත්පසින්ම වෙනස්ය. යමෙකුට අතපසු වුණු කොටසක් පිළිබඳව එය නැරඹූ වෙන එකුගෙන් අසා දැන ගන්නට දෙයක් එහි ඉතිරි නොවේ.

"දුව මට ඊයේ "හඳ පලුව" ඩ්‍රාමා එක බලන්න බැරිවුනානේ. මොකද වුනේ ඊයේ"

"ආ... ඊයේ ඉසුරුගේ ගෙදරට ආවනෙ කට්ටියම වෙඩින් එක ගැන කතාකරගන්න."

"ඉතිං ඊට පස්සේ."

"ඉතිං ඒ ගොල්ලෝ තේ බීබී ඒ ගැන කතාකලා."

"පස්සේ මොකද උනේ."

"කට්ටිය තේ බීබී එක එක්කෙනාගෙ අදහස් කිව්වා."

"කල්පනීලගෙ ගෙදර දේවල් පෙන්නුවේ නැද්ද"

ඒව පෙන්නුවේ නෑ. කට්ටිය කතා කරන එක තමයි පෙන්නුවේ."

"ඊට පස්සේ මොකද "

ඊට පස්සේ ඉතිං වෙළඳ දැන්වීම් පෙන්නුව. ආයිත් කට්ටිය කතා කර කර ඉන්නවා පෙන්නුවා."

"මේ මොන විකාරයක්ද මුළු කතාවේම තිබුනෙ එච්චරද?"

ඔව් එච්චරයි. ඉතිං මම මොනවා කරන්නද අම්මේ. ඊයෙ කොටස එච්චරයි."

දිනපතා පෙන්වන බහුතරයක් මෙගා ටෙලිනට්‍යවල තත්වය ඉහත අයුරුය. කෙසේ හෝ එදා දවසේ ජාම බේරාගැනීමට ඒවායේ අධ්‍යක්ෂවරු දක්ෂය.

සතියේ දිනවල කොටස් වශයෙන් ප්‍රචාරය වන ටෙලිනාට්‍ය සතිඅන්තයේ එක දිගට නැරඹීමේ පහසුකම්ද දැන් දැන් ප්‍රේක්ෂකයන්ට උදාවී ඇත. ඒ අනුව මගහැරුනු අතපසුවුණු පසුගිය කොටස් හත අටක්ම එක දිගට බලාගත හැකිය. ඒ අනුව දහවල් පටන් සවස ඇඳිරි වැටෙන තෙක්ම ඇතැම් විට පැය හතරක් පහක් පුරාම ඒවා විකාශය කෙරේ. මේවාට ඇබ්බැහි වී ඇති අයවලුන් මුලු සතිඅන්තයේම සියලු වැඩ පසෙකලා රූපවාහිනීය අසල ගෙවා දමන අයුරු දැක ගත හැකිය.

### දේවතාවන් බඳු නලු නිලියන් :-

බොහෝ හඬකවන ඉන්දිය ටෙලිනාට්‍ය වල නලු නිළියන් පෙනුමෙන් දේව රූප මෙනි. තොල් සායම් ක්‍රීම් උලා රෝස පැහැගන්වා ඇත. ඔවුන් එක දිගට පැය දෙක තුනක් දුව පැන නැටුවද දහඩිය කඳුලක් නැත. කොණ්ඩය අවුල් වන්නේද නැත. තොල් සායම්ද මැකී නොයයි. මේවා බලා සිටින අපගේ ඇතැම් යුවතියන්ද තමන්ටද එසේ විය හැකි යැයි සිතා ඒ අයුරින්ම මේකප් දමාගෙන එළිමහනේ ඇවිද යද්දී විනාඩි දෙක තුනක් යන්නටත් මත්තෙන් ඉහිං කනිං දහඩිය පෙරාගන්නා අයුරු දැකගත හකිය. ඒ අනුව බලන කල ඉන්දියාවේ අධිරජ ධර්මාශෝකට ලංකාවේ මහරජ ගැමුණු පරාද වී දැයි සැක සිතේ

### නව පරපුරේ ගීත ගායනා.

මියුසික් වීඩියෝ අද රූපවාහිනී නාලිකා අතර බොහෝ විට ජනප්‍රිය අංගයකි. දිනපතා නවක ගායක ගායිකාවන්ගේ ගීත එමගින් අඩු නැතුවම ප්‍රචාරය කෙරේ. ඇතැම් අය තම විඩියෝව සඳහා රුපියල් ලක්‍ෂ ගණනින් වියදම් කොට ඇති බැව් ඒවායේ රූප රාමු වලින් පෙනේ. එහි ඇති රූපවල ගුනාත්මක භාවයද ශබ්ද වල තීව්‍රතාවයද ඉතා ඉහලය නමුත් අවාසනාවකට එතරම් වියදමක් දරා වුව ඔවුන් එම ගීතවලින් ඉදිරිපත් කරනුයේ කුමක්දැයි විමසා බැලීම වටී. ඉන් 95% ක් පමණ ඇත්තේ විරහ ගීය. ඒවායේ පෙම්වතා කඳුලු වගුරා හොටු පෙරාගෙන අඬනු පෙනේ. පෙම්වතිය එලෙස බලා සිටිනුයේ වගේ වගක් නොමැති අයුරිනි. මේවා නරඹන ඇතැම් ප්‍රේක්‍ෂකයින් ළය උණු වී දැසින් කඳුලු වගුරන අයුරු වර්ථමානයේ සුලබය. තමන්ගේ දෙමාපියන්ගේ වියෝවකදී වුව කඳුලක් නොහෙලන ඇතැමුන් ගීයක, ටෙලිනාට්‍යයක තිබෙන දෙයක් දැක හඬා වැටෙනුයේ කෙසේදැයි සිතා ගත නොහැකිය. එවන් අවස්ථාවලදී උරය පලා ලේ දෙන්නට වුවද සුදානම් වන තරමට ඔවුන් තුළ අනුකම්පාව දෝරෙ ගලායනු පෙනේ. නමුත් හිගන්නෙක් ගෙදරට පැමිණියද සතපහක් දෙන්නට ඔවුන් මැලිවේ.

### තෑගි දිනාගැනීම.

ඇතැම් නාලිකාවල වැඩසටහන් විකාශය කෙරෙන අතර තිරයේ දිස්වන මොනවා හෝ රූපයක් පිළිබඳ ප්‍රශ්නයක් අසා ත්‍යාග පිරිනමන අවස්ථාද තිබේ. ත්‍යාග දිනාගැනීමටනම් කිසියම් කාලසීමාවක් තුළ අදාල රූපය කොතරම් වාර ගණනක් තිරයේ දිස්වන්නේදැයි සොයාගත යුතුය. එහිදී එම කාලසීමාව පැය දෙක තුනක් විය හැක. නොඑසේනම් වරුවක් හෝ දවසක් විය හැක. කෙසේ හෝ තෑග්ගට ඇති ගිජුකම නිසාම රූපවාහිනීය දෙස ඇසපිය නොහෙළා බලාහිඳිමින් ගෙදර සියලු වැඩ අතපසුකරගන්නා අයද සිටී. (එසේම ත්‍යාග දිනාගත් අයෙකු නම් තාම මට මුණගැසීද නැත.)

අදවන විට ආලින්දයේ වාඩිවී රූපවාහිණිය දෙස මුව අයා බලාසිටින සියලු දෙනා මෙහයවීමේ නිශේධ බලය මාධ්‍ය ආයතන විසින් අත්පත් කරගෙන ඇත. ඒ ඒ නාලිකා හරහා ඔවුනට උවමනා පරිදි පෙන්වන දේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් බැලීම හැරෙන්නට ප්‍රේක්ෂකයාට අන් කළ හැකි කිසිවක් නොමැත. දවස තිස්සේ වෙහෙස මහන්සි වී බස්රථයේ හෝ දුම්රියේ තැළි පොඩීවී නොඑසේනම් කාර්යාලයේ දහසකතුත් එකක් ප්‍රශ්න මැද ගතකර සවස් යාමයේ රූපවාහිනිය අභියස වාඩිවෙන ඕනෑම අයෙකුට කිසියම් නිශ්චිත වැඩසටහනක් බැලීම වෙනුවෙන් තම වටිනා කාලය බොහෝ සේ කැපකළ යුතුවේ. ටෙලි නාට්‍ය, ප්‍රවෘත්ති හෝ වෙනත් කාලීණ වැදගත් කමින් යුත් වැඩසටහනක් නැරඹීමේදි එහි අතර මැදින් යොදන වෙළඳ දැන්වීම්, නිවේදක නිවේදිකාවන්ගේ කිසිදු අදාළත්වයක් නොමැති කථා, වෙනත් තමන්ට අනවශ්‍ය තොරතුරු සියල්ලද ප්‍රේක්‍ෂකයා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් බලාසිටිය යුතු වේ.

කෙසේ වූවද, ඉහත අපහසුතා මඟහරවා කාලය ඉතිරි කරගනිමින් තමන්ට අවශ්‍ය තමන් කැමැති දේ පමණක් නරඹා මාධ්‍ය ආයතනවල හෝ නාලිකාවල අවශ්‍යතාවය අනුව නැටවෙන්නේ නැති ප්‍රේක්ෂකයෙකු වීමේ මහගු වාසනාව තාක්ෂණයේ පිහිටෙන් දැන් උදාවී ඇත. ඒ අනුව පසුගිය වැඩසටහන් නැවත නැරඹීමේ පහසුකම් සහිත රූපවාහිනී සම්බන්ධථාවයක් තම නිවසට සවිකර ගැනීම මගින් ඉහත හිසරදයෙන් බේරීමේ හැකියාව ප්‍රේක්‍ෂකයාට ලැබේ.

තමන්ට අවශ්‍ය වැඩසටහන විකාශය වී පැය භාගයක් හෝ පැයක් ගිය පසු රූපවාහිණිය ඉදිරිපිට වාඩිවී ඉන් තමාට වඩාත්ම අවශ්‍ය තමන් කැමතිම කොටස පමණක් ඉදිරියට (Forwerd) හෝ පසුපසට (Rewars) යවා නැරඹීම තුළින් කිසිදු නාලිකාවකට තමාව හැසිරවීමට ඉඩක් නොතබා තම වටිනා කාලය ඉතිරි කරගැනීමේ හැකියාව එමගින් ලැබේ. අවශ්‍ය වන්නේ මදක් ඉවසීමෙන් හිඳීම පමණි. මෙම ක්‍රමය රූපවාහිනිය හරහා විපතට පත්ව ඇති ඕනෑම අයෙකුට වඩා යෝග්‍ය බැව් මගේ හැඟීමයි.

එක්තරා දිනෙක සවස අප නිවසට මාගේ දියණියගේ යෙහෙලියෝ පිරිසක් පැමිණියහ. ඒ අතර, දෙමාපියෝ කිහිපදෙනෙකුද වූහ. ඇතමෙක් අප නිවසට පැමිණි පළමු අවස්ථාව එය විය. කලකට පසුව සිදුවූ එම හමුව අප සැමගේ උද්ධාමයට හේතු වී තිබු හෙයින් ඔවුනට ඉහලින්ම ආගන්තුක සත්කාර කිරීමට දියණියද, බිරිඳද උපරිමව කැපවූහ. ඔවුන්ටද අප නිවසට පැමිණීම නැවුම් අත්දැකීමක් වනු ඇති බව අපගේද විශ්වාසය විය. නමුත් සිදුවූයේ අනෙකකි. නිවසට පැමිණි වහාම එහි සිටි එක් දියණියක් මා බිරිඳ අමතා

"අනේ ආන්ටි චුට්ටක් ටීවී එක දාලදෙන්නකෝ... මම නොවරදවාම බලන ටෙලි නාට්‍යයක් තියෙනවා මේ වෙලාවේ" ඇය කීවාය. නිවසට ගොඩවූ සැනින් ඔවුන් පිළිගන්නටත් පෙරම පැමිණියවුන් අතර සිටි අදාළ දූරියගේ ඉල්ලීම පරිදි අපි රූපවාහිනිය ක්‍රියාත්මක කළෙමු. පුදුමයකි. වැඩි වේලාවක් යන්නටත් මත්තෙන් පැමිණි දියණියන් මෙන්ම මව්වරුන්ද කිසිදු කතාබහකින් තොරව රූපවාහිනියට යොමුවූවා මිස කලකින් දුටු තම මිතුරිය වූ මාගේ දියණිය සමඟ හෝ අප කිසිවකු සමඟ කතාබස් කරන්නට තරම් වගක් ඔවුනට නොවීය. ඒ තරමටම ඔවුන් රූපවාහිණියට ඇබ්බැහිවී සිටිනු දක්නා ලදි.

ආලින්දයේ රූප පෙට්ටිය හරහා අප රටෙහි සාම්ප්‍රදායික පවුල් පසුබිමට හා සමාජයට සිදුව ඇති අයහපත් බලපෑම තක්සේරු කළ නොහැකි තරම්ය. එකී දියුණු තාක්‍ෂණික මෙවලම හරහා අත්කර ගන්නා ප්‍රතිලාභ වලට වඩා සිදුකරගෙන ඇති අවාසිය කෙතරම්දැයි මැන බැලීම වටී. මෙහි වඩාත්ම කනගාටුදායක කරුණ වනුයේ මොනතරම් පන්ඩිතකම් දෙඩුවද මට වුව මගේ නිවසේද උද්ගතව ඇති ඉහත තත්වය පාලනය කිරීමට නොහැකි වීමය. එනිසාම රූපවාහිනීය ලොවට දායාදකළ පුද්ගලයාගේ මව්පිය පාර්ශවය සිහිකොට මා ඇඳ කෙළවරෙහි වම් ඇලයට හැරී නිදා ගත්තේ රූපවාහිනීය නරඹමින් සිටින බිරිඳටද මැදියමේ හෝ එහි පැමිණ නිදාගන්නට ඉඩ ඉතිරි කරමිනි.

**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**
යුධ සමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය

# රහ කෑලි

## තව පාරක්



**සැමියා .**
"මම ඩ්‍රයිවර්ව අදම අස් කරලා දානවා. මේ යකා කාරෙක එලවගෙන යන හැටි කිසිම කමකට නෑ. අද මාව මැරෙන්න ගියේ තුන්වෙනි පාරට".

**බිරිඳ.**
"කලබල වෙන්න එපා අනේ. තව එක පාරක් ඉඩ දීලා බලමු.."



## ෂොක් එක

රූපවාහිණියක් මිලදී ගත් කතක් එහි විදුලි කම්බි දෙස විමසිල්ලෙන් බලා වෙළඳ සේවකයාගෙන් මෙසේ ඇසුවාය..

"මේකෙන් මට ෂොක් එකක් වදීවිද"?..

"ඕකෙනම් ෂොක් වදින්නෙ නැහැ.. හැබැයි ඒකෙ යන සමහර වැඩසටහන් දැක්කම නම් නෝනට ඉබේටම ෂොක් වදියි"

## ඔට්ටුව

හොලිවුඩ් චිත්‍රපට නිෂ්පාදක යුවලක් වන සිඩ්නි හා ඕසන් අප්‍රිකාවේ වන ජීවින් හා සම්බන්ධ චිත්‍රපටයක් නිපදවමින් සිටියේය..

"මට හිතයි රෑ කෑමට සිංහයෙක් දඩයම් කරන් එන්න" සිඩ්නි කීවේය.

"ඔට්ටුද බෑ" ඕසන් කීවේය.

"ඔයාට සිංහයෙක් මරන්න බෑ මම ඩොලර් සීයක් ඔට්ටු අල්ලනවා".

"හොඳයි බලමු" සිඩ්න් තුවක්කුවක් ගෙන වනන්තරයට යමින් පැවසුවේය

පැයකට පසුව ඕසන්ගේ කූඩාරමෙන් හිස ඇතුලට දැමූ සිංහයෙක් "ඔබ සිඩ්නි කියලා මහත්තයෙක් ගැන දන්නවාද" යි  ඇසුවේය.

"ඔව් ඒ මගෙ මහත්තයා"

"එහෙමද" සිංහයා ඇසුවේය.

"මෙන්න ඔයාගේ ඩොලර් සීය මට සිඩ්නි දෙන්න කීවා"..

## ඒකයි හේතුව

**විනිශ්චයකරු.**
"පසුගිය අවුරුදු දහය තිස්සෙම යුෂ්මතා මේ අධිකරණයේ පෙනීසිටියා මට මතකයි"..

**විත්තිකරු.**
"එහෙමයි ස්වාමිනී පසු ගිය අවුරුදු දහය තිස්සෙම තමුන්නාන්සෙ මේ උසාවියේ සිටිය නිසා වෙන්න ඇති".

## එහෙනම් හත් අවුරුද්දයි.

නඩු තීන්දුව දෙන්නට කලින් විනිශ්චයකරු විත්තිකරුගේ මුහුණ දෙස රවා බලා "මට තමාගේ මුහුණ පුරුදුයි මම තමාව දැකලා තියෙන්නෙ කොහෙදිද?".

"ඇයි තමුන්නාන්සෙගෙ බාල දූට සංගීතය ඉගැන්නුවේ මම නොවැ". යි බලාපොරොත්තු සහගත ස්වරයකින් පිළිතුරු දුන්නේය.

යලි ඔලුව උස්සා බැලුවෙවත් නැතිව නඩුකාරයා ක්ෂණයකින් තීන්දුව දුන්නේය.. "බරපතල වැඩ ඇතිව හත් අවුරුද්දයි"..



## ගිනි අවිය

සය මාසයක් දුක් විඳ පුහුණුව ලැබුවා
සටන් බිමට අපි හැමෝම එක්වූවා
දිව රෑ දෙකහි බංකරයේ නිදි වැරුවා
මේ ගිනි අවිය මගෙ තණිකම නැති කෙරුවා

තල්කොට ගෙනල්ලයි බංකර් හදන්නේ
වැලිපර දමා එය වටකර රකින්නේ
උදේ හවා දහදුක් අප විඳින්නේ
රට වෙනුවෙනුයි ජීවිත පුද කරන්නේ

පාසල් සමය මට නිතරම සිහිවෙනවා
ඔය සුදු මුහුණ නොමැතිව හඳ වැලපෙනවා
පුද කළ සෙනේ හැර නුඹ පිටගං යනවා
අහිතක් නොමැත සෙනෙහස ගඟ උතුරනවා

මේ සටනින් මිය ගියොතින් මා දිනක
මළගමටවත් ඇවිදන් යනවද හනික
හතර රියන් කඩ උරුමය වෙන්න පෙර
නළලට හාදුවක් දෙනවද සුදු මැණික

**සෙ/එල්/100140 සාසෙ ජයලත් බණ්ඩාර එච්එම්ජීඑස්**
වෛද්‍ය පරීක්ෂණාගාරය
කොස්ගම.

## මගේ ගුරුතුමී

ශිල්ප සතර මා හට වේවා
හොඳ ගුණ ගැන කියලා දුන්
මගේ ලොවේ මිණි පහනයි
මගේ ගුරුතුමී...
මලක් වගේ හරි සුවඳයි
මගේ ගුරුතුමී

මලක් වගේ ලෝකයටම
සුවඳ දෙන්න කියලා දුන්
මගේ ලොවේ සුවඳ මලයි
මගේ ගුරුතුමී...
පහන වගේ හරි එළියයි
මගේ ගුරුතුමී...

පහන වගේ මුලු ලෝකෙට
එළිය දෙන්න කියලා දුන්
මගේ ලොවේ මිණි පහනයි
මගේ ගුරුතුමී...

**ප්‍රතිභාවි විදර්ශනි කෝවිලතැන්න**
6 වසර
මහින්ද රජපක්ෂ විදුහල
හෝමාගම

## දයාබර පුංචි දුවට...

නිතරම සිනා පුරවාගෙන මුවග පුරා
දුවපැන නටනවා සැමදා මිදුල පුරා
වැටි වැටී දුවනවා අපෙ පුංචි සරා
මගේ දූ වෙතට කවි ලියවෙයි කොලය පුරා

සපුරා තෙවසරක කාලය ලග එනවා
සුරතල් බල බලා සැමදා හිනැහෙනවා
දවසෙම වඩාගෙන මිදුලෙහි ඇවිදිනවා
කඳ සුරිඳුනෙ සැමදා ඈ රැකදේවා .........

**සෙ/165එච්00627 සාසෙ අබේසිංහ ඒඩීසි**
16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව

## නුඹ ගියා...

සිහිල් මඳ මාරුතේ
වෙඩි සුවඳ මුසු වෙලා...
මුණ ගැසී දෙඩූ තැන්
අපට තහනම් වෙලා...

සිහල පද අතර මැද
දෙමළ පද මුසු වෙලා...
ඔබ කියූ පෙම් කථා
දෙබස් නැසී ගියා...

නළල් තිලකය මකා
මා දකුණෙ තනි වෙලා...
උතුරු කොණ ගිනි අතර
සැඟවිලා නුඹ ගියා...

**හංසි**





කෙටි කතාව

# පුද බෝග

පරණ ලණු පුටුවේ ඇන්දේ දමා තිබූ තුවාය අතට ගත් සිරිදාස එය ගසාදමා ජටාවක් බැඳගෙන කුස්සිය පැත්තට ඇදුණේය. ඒ වනවිට සිරියාවති සිටියේ උදෑසනම කළුවා ලවා කඩවා ගත් කොස් ගෙඩියේ මදුළු ඉවත් කරමිනි. සිරියාවතී අසලට සිරිදාස ළං වූයේ 'කිරි කොස් මාලුවට යසයි වගේ'' කියමිණ. ඔහු එසේ පැවසුවේ අද දහවලට කිරි කොස් මාලුවක රස බැලීමට හැකි වෙතැයි අනුමාන කරමිනි. හිස දෙපැත්තෙන් කඩා වැටුණු සුදු කෙස් රොද පසකට කළ සිරියාවතී 'හ්ම්' කීවා මිසක වචනයක් වත් කතා නොකළාය.

සිරියාවතී කවදත් නිහඬ චරිතයකි. සැමියා කිරි කොස් මාලුවට මහත් ගිජු බවක් දක්වන බව දන්නා ඇය අද උදයේම කළුවට කියා කොස් ගෙඩියක් බාවා ගත්තේ ද ඔහුගේ ආශාව ඉටු කරනු පිණිසත් වෙලේ වැඩකරන ලොකු පුතා ඇතුළු කීප දෙනාට  දවල් බත උයනු පිණිසත් ය.

'අන්න මම කහට ඩිංගිත්තක් වක්කෙරුවා ඒක බීලා හිටියා නම්...'

තමන් අසල ගැවසෙන සැමියා දෙස බැලූ සිරියාවතී ඇඳිවතේ වතුර පිසිමින් කුස්සියට ඇඳුණේය. විවාහ වී අවුරුදු හතලිහක් ඉක්ම වුවද තම සැමියා කිසි දවසක කුස්සියට වැදී අහුමුළු පීරීමේ එසෙත් නොමැති නම් දැළි වළං අවුස්සා කුස පුරවා ගැනීමේ සිරිතක් නැති බව ඈ දන්නීය. කිතුල් හකුරු කෑල්ල සමඟ කහට කෝප්පය අත තැබූ සිරියාවති නැවත කොස් මදුළු ගලවන්න වුවාය. ලොවි ගහ යට බංකුවේ වාඩිවුණ සිරිදාස හෙමින් සීරුවේ කහට කෝප්පය තොල ගාන්නට විය.

"ළමයින්ගේ අම්මේ මට බුලත් කොළයක් දුන්න නම්..."

විවාහ වූ දවසේ සිට ලොකු දරුවා ලැබෙන තෙක්ම සිරිදාසට ඇය මැණිකේ විය. ලොකු පුතා ලැබුණු පසු දරුවාගේ අම්මා වී, දරුවන් දෙන්නා තුන්දෙනා වන විට ළමයින්ගෙ අම්මා විය. සැබවින්ම සිරිදාසට ඇය මවක්ම විය. විවාහ වූ මුල් දවස්වල සිරියාවතීට සිරිදාස මහත්තයා විය. ඉන්

පසු ලොකු පුතා සරණපාල ලැබුණ පසු දරුවගෙ තාත්තා වී මේ වන විට දරුවන්ගේ තාත්තා බවට පත්වී තිබේ. ගොවිතැන් බත තම ජීවිතය කරගත් මොවුන් දෙදෙනා ට දරුවන් 05 දෙනෙකි. අගහිඟකම් වලින් නොපිරුණු ඔවුන්ගේ ජීවිත සුවඳවත් වූයේ දෙමහල්ලන්ගේ දහඩියේ සුවඳිනි.

ගෙයි ඇතුළට ගොස් බුලත් කොලයක් ගෙන විත් සිරිදාස අත තැබූ සිරියාවතී ''ඉක්මනට උයන්න එපැයි. වෙලට බත් ටික ඉක්මනට ඕනි කියල ලොකු දරුව කිව්වා. කෝ... මේ ඉන්දුමතී ඔය බත් හැලිය රොස් වෙනවද කොහෙද පොඩ්ඩක් බලාපන් දුවේ'' යැයි ලේලියට කෑගසමින් කොස් කැපූ  මන්නයේ පොල් තෙල් ටිකක් තවරන්නට වූවාය.

ඉණේ තිබූ බුලත් මඩිස්සලය අතට ගත් සිරිදාස අඩුවැඩිය දමා බුලත් විටක් ඒදා ගත්හ. මදක් සම වැහැරී ශරීරය කෘෂ වුවත් සිරිදාසගේ දත් තවමත් හයිය හත්තියට ඇත. තරුණයෙකුට මෙන් තවමත් කරුංකා ගෙඩියක් වුවත් මුවට දමා දත් තිස්දෙක අතරේ එහාට මෙහාට කර තලා ගැනීමට ඔහුට හැකිය. ඔහුගේ දත් මේ තරමට ශක්තිමත් වූයේ තමන් කිසිදාක බොරු නොකියන නිසා බව සිරිදාස පවසයි. බුලත් විට පදම් වූ පසු සිරිදාස බංකුවෙන් නැගිට්ටාය.

'''මේ කොයි යන්නද?''

සිරියාවතී විමසීය.

'''වෙලට යන්න කියලා. නිකන් ඉන්න කම්මැලියි...'' සිරිදාස පැවසීය.

XXX

සිරිදාසට සැබවින්ම වැඩක්පලක් නැතිව නිකන් ඉන්න බැරිබව සිරියාවතී ද දනී. පලකට ඇති වැඩක් නැතිනම් මිදුලේ තණකොළ හෝ උදළුගෑම ඔහුගේ සිරිතයි. කුඹුරු අක්කර දෙකක සින්නක්කර හිමිකාරයෙක් වූ සිරිදාස වරක් හොඳම ගොවියා ලෙස සම්මාන ද ලැබීය. එත්  කැත්තේ උදලුලේ වැඩ බැරිවීමටත් පෙර ඔහුට ගොවිතැන් බතින් ඉවත්වන්නට සිදුවිය. ඉවත්වූවා නොව එය දරුවන්ගේ උවමනාවට බලහත්කාරයෙන් කළ ඉවත්වීමකි. දරුවෝ තිදෙනාම රජයේ රැකියාවල් කරති. ඔවුන් පදිංචිව ඇත්තේ ද නගරයේය. දියණිය ද විශ්වවිද්‍යාල සමයේ ඇති කර ගත් ප්‍රේම සම්බන්ධයක් දුරදිග ගොස් කසාද බැඳ සැමියාගේ නිවසේම පදිංචිව සිටියි. ඔවුන් දෙදෙනාද රජයේ පාසලක ගුරුවරුය. ඔවුන් කිසිවිටක ගොවිතැන් බතට ඇල්මක් බැල්මක් නොමැති බැවින් සියලු ඉඩකඩම් ලොකු පුතා වූ සරණපාලට පැවරුණි.

''අපිට ඔය කුඹුරු වතුපිටි ඕනැ නෑ තාත්තෙ. ඕව ඔක්කොම ලොකු අයියට දෙන්න''

එක් සිංහල අවුරුද්දට නිවසට පැමිණි දරුවන්ගේ තීරණය එළෙස විය.  දරුවන් සිව් දෙනාගේ උවමනාවට අනුව ගේ දොර,  වතුපිටි, කුඹුරු ඉඩකඩම් ආදියේ පාලනය සරණපාල ලොකු පුතු අතට පත්වුයේ වූයේ සිරිදාසට හිතාග න්නත් බැරි විදියටය.

''ඔන්න ඔය ළමයී කියන එකක් අහල පුතාලයි තාත්ත දැන් විවේක පාඩුවෙ හිටියෙත් නරකද?'

බිරිඳගේ අදහස ද දරුවන්ගේ අදහසම විය. ''මට තාම හයිය හත්තිය තියෙනව''  සිරිදාස පැවසිය.

''ඒකට කමක් නැහැ. තාත්තා අපි කියන දේ අහලා ලොකු අයියට ඉඩකඩම්වල වැඩ කරන්න දීල පාඩුවෙ හිටිය නම් තමයි හොඳ. තාත්ත ඉතින් පුළුවන් කාලේ ගොඩක් දුක් වින්ඳනෙ''

දරුවන්ගේ බල කිරිම හා බිරිඳගේ ඉල්ලීම මත සිරිදාසට තම සුපුරුදු ජීවන රටාවෙන් ඉවත් වන්නට සිදුවිය. එහෙත් ඔහු මහගෙදර වත්තේ දැනුදු සුළු සුළුවට ගොවිතැන් බත් කරයි.

''වෙලට ගියාට කාරි නෑ දරුවන්ගේ හිත් එහෙම රිදවනව නොවෙයි ඇද කුද හොයන්න ගිහිල්ල''

සිරියාවතී තම සැමියාට තරවටු කළාය. සිරිදාසට සරණපාල පුතාගේ ගොවිතැන්බත් ගැන කිසිම පැහැදිමක් නැත. ඔහුගේ ගොවිතැන්බත් කිරිමේ එකම අරමුණ ආහාරය සඳහා නොව මුදල් සඳහා ය. යන්ත්‍ර සූත්‍ර යොදා වස විස යොදා ගෙන ගොවිතැන් කිරීම මහා අපරාධයක් ලෙස සිරිදාසට පෙනේ. සරණපාල පුතා කුඹුරු වගා කළ මුල් කන්නයේදීම කුඹුරුවල සීසෑම සඳහා ට්‍රැක්ටර් පැමිණියේය. ට්‍රැක්ටර්වලින් ඔහු ද සීසාන බව පැවසූ විට සිරිදාස එයට තදින්ම විරුද්ධ විය.

''මක්කෙයි ඔය කරන්න හදන විනාසේ. හප්පේ වෙලේ නියරවල් ටිකත් ඉවරයි. අර ගොන් බානක් ගෙදර ඉන්නවා අපූරුවට කැපෙන උදලුලක්, නගුලක් තියෙනවා. උඹට පිස්සුද ඔය සල්ලි ගොඩක් දීලා මැෂින් එකකින් වැඩ කරව ගන්න. ගොනුන්ගෙන් බැරි නම් අර දියෝනිස්ගේ හරක් ටික අරගෙන මඩවා ගනින්. ඔය යන්ත්‍ර සූත්තර තිබිලයැ උඹලා පස් දෙනෙක්ගෙ මම බඩ පිරෙව්වෙ''

'තාත්තෙ !. ඒ තාත්තලගෙ කාලේ. මේ අපේ කාලේ. අපේ කාලේ විදියටයි අපි වැඩ කරන්න ඕනි. අර සියදෝරිස් මාමත් මේ සැරේ කුඹුරට ට්‍රැක්ටරය දානව''

''ඒක හරි!.ඒක හරි!. සියදෝරිස්ගෙ කුඹුර ගොඩ එකක් නොවැ. ඒක ඉතින් මඩ කරන්න අමාරුයි තමයි.  ඒත් මගේ කුඹුරු එහෙමද?  කකුලින් මඩ කරගන්න පුළුවන් රත්තරන් ටිකට''

සිරිදාසගේ වචනය තඹයකට මායිම් නොකළ සරණපාල එම කන්නයේ ට්‍රැක්ටරයෙන් කුඹුර මඩකර වැපිරුවා පමණක් නොව, ලොකු ට්‍රැක්ටරය යොදා ගෙන ගොයම් ටික ද පෑගුවේය. මහ ට්‍රැක්ටර යොදා ගෙන මහවැලියේ ගොයම් පාගනවා කියා සිරිදාස අසා තිබුණාට එය දැක තිබුණේ නැත. මුලින්ම කුඹුරු වැඩ සඳහා ගමට පැමිණියේ මහ ට්‍රැක්ටරයය. ඉන් පසු විවිධ නමින් හැඳින්වෙන යන්ත්‍ර සූත්‍ර ගොවිතැන් වැඩ සඳහා පැමිණයේය. මෑත කාලයේ ගොයම් කැපීමට යන්ත්‍රයක් ගමට පැමිණියේය. ඊට පසු ගොයම් කපන ගමන් පෑගෙන මැෂින් එකක් ගම ආක්‍රමණය කළේය. එය භූතයා විය. අද සිරිදාසගේ කුඹුරු කැපීමට අලුත් යන්ත්‍රයක සහය  සරණපාල ලබා ගනී. එය ''සුනාමි'' නමින් ගොවියන් හඳුන්වයි. එමඟින් ගොයම් කැපී, පෑගී, හුළං වී බැත පමණක් එළියට පැමිණේ. කුඹුර හිමියට තියෙන්නෙ ගෝනි ටික මැෂින් එකේ කට මුලට ඇල්ලීම පමණි. යස අගේට වී ටික ගෝණියට වැටේ.

මේ සියල්ල සිරිදාස දුටුවේ මහ නස්පැත්තියක් විලසය. බුද්ධ භෝගවලට කරන අගෞරවයක් විදියට ය.

සිරිදාස කුඹුරු වැපිරූ කාලේ කිසි දිනක රසායනික පොහොර තෙල් වර්ග භාවිතා කළේ නැත. වස විෂ ගසා සතුන් මැරීම බලවත් පාපකර්මයක් ලෙස ඔහු සිතුවේය. ගොයම් පණුවන් සිටී නම් ඔහු කරන්නේ ගෙවත්තේ තියෙන පොල් පිති ටිකක් කපාගෙන ගොස් ගොයමට උඩින් කුඹුරේ

තැන තැන සිටුවීමයි. ගොදුරු සොයන කුරුල්ලන් අපූරුවට ඒ පොල්පිති උඩට වී ඉඳ පනුවන් අසුලාගෙන කයි. වෙනත් රෝගයක් ඇති වුවහොත් කුමක් හෝ කෙමක් කරයි.

"කෘමිනාශක ගහන්න හොඳ නැත්නම් පව් සිද්ධ වෙනවා කියලා. තාත්තා පොලිපිති ඉන්දලා ඒකේ කුරුල්ලො වහල පනුවො ඇහිඳගෙන කන එක පාපකර්මයක් නෙමෙයිද?"

කෘමිනාශක කුඹුරට ඉහීමට විරුද්ධ වූ විට සරණපාල තම පියගෙන් විමසීය.

"ඒකත් පව් සිද්ධවෙන වැඩක් තමයි. ඒත් ඔය තරම් පාප කර්මයක් වෙන්නෙ නෑ. ඒ සතුන් නිස්කාරනේ මැරිල යන්නේ නැහැ. උන් තවත් සතෙකුගේ කුස පුරවනව. ඒත් උඹලා කරන වැඩෙන් ඒ සතුන්ටත් වැඩක් නැහැ. කුරුල්ලන්ටත් වැඩක් නැහැ. සිද්ධ වෙන්නෙ පව විතරමයි."

සරණපාලට දෙවැනිවීමට සිරිදාස ද සූදානම් නැත.

XXX

බිරිඳගේ වදන් නෑසුනාක් මෙන් සිරිදාස කුඹුරු යාය දෙසට යන්නට විය. මහ ඇලේ වතුර කඳුලක් නැත. ඒ ගොයම් පැහී ඇති නිසාවෙන් වාරිමාර්ගයේ මහත්වරු වතුර නවත්තලාය. සිරිදාස මහ ඇල ඉවුරෙන් ගොඩ වී කුඹුරු යාය දෙස බැලුවේය. සෑම කුඹුරකම මිනිසුන් නොව වැඩිපුර තිබෙන්නේ විවිධ මාදිලියේ මැෂින්ය. බරකරගත් හිසින් යුතුව ඇළ කණ්ඩියෙන් පැන මඳ දුරක් ගිය සිරිදාසගේ දෙපා කුඹුරු යාය වෙත නොයා අනිත් පසින් ගලා යන ''මව්ආර'' පැත්තට ඇදෙන්නට විය. ''මව්ආර'' පසෙක තිබූ විශාල කුඹුක් ගස තවමත් නිරුපද්‍රිතව තිබීම සිරිදාසගේ සිතට ගෙන ආවේ මහත් සතුටකි. එකල අවට වෙල්වල වැඩ කරන සෑම ගොවියෙකුගෙම සරතැස නිවූ මෙම කුඹුක් ගස ගැමියන් හැඳින්වූයේ "මහ කුඹුකේ" යන ගෞරව නාමයෙනි. අතුපතර විහිදී වැඩී ගිය කුඹුක් ගසේ මුලමත වාඩි වූ සිරිදාසගේ සිත අතීතය වෙත දිව යන්නට විය.

සිරිදාස "හම්බේගමුවේ" ගංකාරයෙක් නොවීය. කල්තොට ප්‍රදේශයේ ළමා කාලය ගෙවූ ඔහු පවුලේ එකම දරුවා විය. මව මිය ගියේ සිරිදාසට යන්තම් අවු 12 පිරෙන කොටය. ඔහු ඉගෙන ගත්තේද දෙකේ කැලෑසියට පමණි. නාඹර වියේදීම සිරිදාස හම්බේගමුවේ පදිංචියට පැමිණි අයුරු දූනුදු සිතුවම් පටයක් සේ ඔහු නෙත් මානයේ ඇඳී යන්නට විය. සිරිදාසගේ පියා ද හොඳ ගොවියෙකි. එහෙත් ඔහුට කියා එක බිම් අඟලක් වත් නොතිබුනී. ඒ නිසා යල - මහ දෙකන්නයම කාගේ හෝ කුඹුරක් අඳේට වැඩ කළේය. එකල ආණ්ඩුවෙන් ගොවි ජනපද ව්‍යාපාරයට නව පනක් දෙමින් ඈත ගම් දනව්වල කැඩී බිඳී තිබූ වැව් පිළිසකර කරමින් ද සමහර වැව් වැඩි දියුණු කරමින් ද අළුත් ඉඩම් ගොවියන්ට බෙදාදුන් අවධියයි. හම්බේගමුවේ වැවද ප්‍රතිසංස්කරණය කර ගොඩ මඩ ඉඩම් දෙනබව දැනගත් සිරිදාසගේ පියා ගමේ ආරච්චිල මාර්ග යෙන් ඉඩමක් ඉල්ලා පෝරමයක් දෙන ලදි. එහි ප්‍රතිඵලය වුයේ සිරිදාසගේ පියාට ගොඩින් අක්කර දෙකකුත්, මඩින් අක්කර දෙකකුත් හම්බේගමුවේ ජනපද ව්‍යාපාරය වම් ඉවුර යටතේ ලැබීමයි..

''ඔන්න පුතේ මීට පස්සෙ නඩේ ගැහිලි රස්තියාදු ගැහිලි නවත්තන්න ඕනි. මහ ආණ්ඩුවේ ලොකු මහත්තැන්වලට බුදුබව අත්වෙන්න අපිටත් මහ පොළොවෙන් බිම් ඩිංගිත්තක් හම්බ වුණා. තව දවස් දෙක තුනකින් උඹ සූජානම් වෙන්න ඕනි මාත් එක්ක එහේ යන්න''

එක් දිනක් සිරිදාසත් ඔහුගේ පියාත් උපන් ගම අතහැර නිවසේ තිබූ සබ්බ සකලමනාවද කරත්තයේ පටවාගෙන හම්බේගමුවට ගොස් ලැබුණු ගොඩ ඉඩමේ පැලක් තනාගෙන අලුත් ජීවිතය පටන් ගත්හ. මුලින්ම කුඹුරු ඉඩම් කැල්ලේ මහ කැලය සුද්ධ කර නියර මාං දමා කොටසක් අස්වද්දන ලදී. සිරිදාස පියා පරදවමින් සෑම වෙලාවකම කුඹුරු වෙනුවෙන් දිවා රෑ නොබලා මහන්සි විය. කන්න දෙක තුනක් යනවිට ඔවුන් නොදනීම අක්කර දෙකක වපසරිය කුඹුරු ඉඩමක් බවට පත්විය. ගොඩ ඉඩම පොල්, පුවක් දෙල්, කොස්, තැඹිලි යායක් බවට පත්විය. එහෙත් අවාසනාවක තරම අස්වැද්දූ කුඹුරේ සිරිදාසගේ පියාට බත් කන්න ලැබුණේ කන්න දෙක තුනකි. නොසිතූ ලෙස සිරිදාසගේ ජීවිතයට මහත් අඩුවක් තබා කුඹුරේ පැල් රකිමින් සිටි පියා වල් අලි පහරකින් මිය යන ලදී. එතැන් සිට සෑම කන්නයකම කුඹුර කපා ගොඩ ගත් සැටියේම සිරිදාස කරනුයේ බුදුන්ගේ කොටස වෙන් කර ඊට පසු තම පියාට බුදු බව පතා සාංඝික දානයක් දීමයි.

ජීවිතයේ අඩුව පුරවා ගනු සඳහා පියා මිය යෑමෙන් වසර කිහිපයකට පසු සිරිදස කල්තොට ප්‍රදේශයේ ජීවත්වූ තම නෑනා වූ සිරියාවතී කැන්දාගෙන ආවේය.

ඉඩම අස්වැද්දූ මුල් කාලයේ කුඹුරේ පස් පෙරළන ලද්දේ උදලුවලිනි. ඒ සී සෑමට හෝ මැඩවීමට ගවයන් කුඹුරට බැස්සවීමට නොහැකි තරමට ගස් මුල් තිබූ බැවිනි. කන්න දෙක තුනක් යන විට මුළු ඉඩමෙම තිබූ මුල් ඉවත් කර දැමීමට සිරිදාසට හැකි විය. ඉන් පසු සිරිදාස කුඹුරේ සීසෑවේ ද ගොයම් පෑගුවේද ගවයන්ගේ පිහිටෙනි.

එකළ වී වපුරා නිවසට රැගෙන බත ඉඳෙන තුරුම නොයෙක් වැඩ සඳහා මිනිසුන්ට උදව් උපකාර වූයේ යන්තර සූත්තර නොව ගවයන් විය. මසට හරක් මරණ බව සිරිදාස දැන ගත්තේ ජීවිතයේ බොහෝ කලකට පසුය. එදා අත්තම් ක්‍රමය මගින් මිනිසුන් තමුන්ගේ ගොවිතැන් බත් කර ගත් ආකාරය මතක් වන විට සිරිදාසගේ සිතට මහත් සතුටක් දැනේ.

'හෙට කුඹුරේ ගොයම් කපනවා...'

දන්නා හඳුනන සෑම අයෙක්ම මුණ ගැසුණු විට සිරිදාස කියයි. පසු දින මුළු වෙලම පිරෙන්නට මිනිසුන් පැමිණ සිටි. ඔවුන්ට දිය යුත්තේ බත් බුලත් පමණි. ඊළඟට කපන්නේ කාගේ කුඹුරද කියා එදින තීරණය වේ. කුඹුරු කැපීම සඳහා ගැහුණු උදවියද එකළ එකතු වූහ. තාලයට කියන ගොයම් කවි වලින් මුළු වෙල් යායම පිරී යද්දී මිනිසුන්ගේ හිතට දැනෙන ආශ්වාදය අපමණය. එත් අද ඇසෙන්නේ ගොරහැඩි මැෂින් වල හඬ පමණි. එකළ මිනිසුන් අතර තිබූ බැඳීම් , සමගිය , එකිනෙකාට උපකාර කර ගැනීමේ ගති සිරිත් විරිත් අද පේනමානයක් නැත. අද උන් අතර ඇත්තේ තරගයකි. එහෙත් දිනන එකෙක් නම් සිරිදාස තවම දැක නැත.

''ජබුං ''හඬින් සිරිදාසගේ දැහැන බිඳුණි. කුඹුක් ගසේ වසා හුන් පිළිහුඩුවා දිය මතුපිට ආ මසෙකු රැගෙන හීයක වේගයෙන් ඈතට ඉගිලුනී. ''හප්පේ... මම කුඹුරෙ යන්න නොවේ ආවේ...'' සිරිදාස කුඹුක් ගස් සෙවනින් ඈත් වී වෙල් යාය දෙසට පිය නගන්නට විය. එක් තැනක ගොයම් කපන මැෂින්ය. තවත් තැනක බැත හුළං කරන මැෂින්ය. තවත් තැනක ගෙයම් පාගන මැෂින්ය. විවිධ මාදිලියේ යන්ත්‍ර සූත්‍ර වෙල් යාය අරක් ගත් රකුසන් සේ සිරිදාසට පෙනෙන්නට විය. එම මැෂින් නගන හඬ සිරිදාසගේ පපු කුහරය කොනිති ගසන්නට විය. ''අප්පේ අපි එදා හරි අපූරුවට කරපු වැඩ ටික දැන් කරන්නේ මැෂින්. මිනිස්සු නිකන් කම්මැලියෝ වෙනවා.



අපේ එකාටත් ඔය කොලෙස්ටරෝල් ද මොකක් ද කියල කියනකොට දිව උලුක් වෙන රෝගයක් තියනවැයි කියන්නේ. ඇයි ඉතින් දාඩිය කඳුලක් වැටෙන්න මුං වැඩ කරනවයැ. ශරීර හොරු. කොයි එකටත් යන්තර, යන්තර අපේ අප්පේ මට දැන් හැත්තැව පැනලත් ඉහින් බහින රෝගයක් නැහැ. ඒකට දැන් ඉන්න ඉළන්දාරින්ට. මුන්ට ඔක්කොම තියෙන්නේ ඉංගිරීසි ලෙඩ''

තනියම තොල් මතුරමින් සිරිදාස කුඹුර වෙත පිය මැන්නේය. ඔහුගේ කුඹුරේද යෝධ මැෂිමකි. ඒකෙන් ගොයම් කැපෙනවා විතරක් නොවෙයි. පැගිලා හුළං වෙලා එළියට එන්නෙ බැත. කළුවට තියෙන්නෙ ගෝනියෙ කට මැෂිමේ කටට අල්ලන එක විතරයි. සුටුස් ගාල ගෝනිය පිරෙනව. ලියදි මුළු හතරේ ගොයම් ගස් කිහිපයක් ඉතිරිව තිබේ. ඒ මැෂින් එක ලොකු නිසා ඒ අතට මේ අතට ආං බාං කරන්න අපහසු නිසා විය යුතුය. ඒ විතරක් ද?. මැෂින් එකේ කට දෙපැත්තෙන් වී ඇට එක දෙක ඉපනැල්ලට වැටේ. ඒව කුකුල්ලුවත් අහුලනවා බොරු. අපෙ අප්පේ මුං කරන විනාශයක්. බුද්ධ භෝග මේ විදියට අපත්තියම් කරනවද? සිරිදාස වැටෙන පිදුරු ගස් ටිකක් අතට ගනිමින් සිතන්නට විය . පිදුරුවලද බැත රැඳී තිබේ.

''මොකද්ද ළමයෝ මේ කරන අපරාදේ බලපන් බැත කොච්චර අපතේ ගිහිල්ලද?''

සිරිදාසගේ ගෝරනාඩුවට සරණපාලගේ මුවගට සිනාවක් නැගුනි.

''නවත්තපල්ලා.... නවත්තපල්ලා.... ඔය දහදුරා මැෂිම. මට තවම හයිය හත්තිය තියෙනව. මට පුළුවන් ඔය ඉතුරු ටික කපල, පාගල පිළිවෙලකට අරගන්න''

සිරිදාසගේ ගෝරනාඩුවට මැෂිම ක්‍රියාකරවන කොල්ලා ගල් ගැසී මැෂිම නැවත් වීය.

''ඇයි තාත්තේ මේ බෙරිහන් දෙන්නෙ. තාත්තා ගෙදර ගිහින් තාත්තගේ වැඩක් බලාගන්න. සුමනෙ මල්ලි තමුසෙට මම කියන්නේ ඉක්මන් කරනවා වැස්සකුත් එන්න වගේ''

සරණපාලගේ හඬින් පණ ලැබූ කොල්ලා නැවතත් මැෂිම ක්‍රියාත්මක කලේය. එය සිරිදාසගේ පපුව උඩින් ගමන් කරන්නාක් මෙන් කුඹුරුයාය පුරා දුවවන්නට විය. සරණපාලගේ යවුල් වදනින් පසාරු වූ සිරිදාසගේ පපුව රිදුම් කන්නට විය. ඔහුගේ නෙතට නිරායාසයෙන් කඳුලක් ගලා ආවේය.

''අප්පේ මෙහෙම බුද්ධ භෝග විනාශයක්''

අසල තිබූ වී කරල් කිහිපයක් අහුලා ගත් සිරිදාස නිවස දෙසට හැරුණි.

බොහෝ හිත් වේදනාවෙන් දවස ගත කළ සිරිදාස එදින දවාලට හෝ රාත්‍රියට බත් කටක් කෑවේ නැත. ගබඩා කාමරයට වැදි දවසේ ඉතිරි පැය කිහිපය ගෙවා දැමුවේය. පසුදින සිරියාවතී තම සැමියාගේ අවදිවීම පමාවූ බැවින් ඔහු නිදන ගබඩා කාමරයට ගොස් මහ හඬින් කතා කළාය. එහෙත් සිරිදාස සෙළවුණේවත් නැත. සිරුරට අත තැබූ සිරියාවතී මහ හඬින් කෑගැසුවාය. ඒ හඬට දිවා ආ සරණපාල ''තාත්තේ තාත්තේ'' කියා තම පියා සොළවා කතා කළ මුත් සිරිදාසගේ මුවින් හඬක් නොනැගිනී. ඇඳේ පසෙකටවී වකුටුව ගිය සිරිදාසගේ අතේ රෝල් වූ ඉඩම් ඔප්පුව හා වී කරල් මිටක් රැඳී තිබුණි.

නිමි.

**ලා/කෝ සුජීව කුමාර කෝවිලතැන්න**







යුද්ධයේදී පූර්ණ අබාධිත තත්වයට පත්වූ විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් රණවිරුවන් තිදෙනෙකු එකම දිනක, එකම ස්ථානයකදී විවාහ දිවියට එළඹිණ. අතිශය විරල සිදුවීමක් වූ එය ඉකුත් ඔක්තෝබර් 24දින කුරුණෑගල බෝයගනේ පිහිටි විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්වුණේ යුද හමුදාපති තුමන්ගේද සහභාගිත්වය ඇතිවය.

සීමා මායිම් නැති සෙනෙහස දෝරෙගලා ගිය ඒ අපුරුව විඳගන්නට එදින ඔවුන්ගේ පවුල්වල සැමද රණවිරුවෝ විශාල පිරිසක්ද එක්රොක්ව සිටියහ. නව දිවියට පියනැගූ යුවතිපති සැමට "රණවරුණ"ද මෙසේ සුභාශිංෂණ එක්කරයි.

# දෝරේ හැලූ සෙනෙහස

අත අත නෑර පියවර මැන ගමනෙ දිවී
සිත නොම පාර සැනසිලි වදනකින් කවී
ඇත ලඟ සාර දිවියක් නෙතු ලඟම මැවී
කත නුඹ වීර බිරිඳකි මගෙ ලොවට සවී

මලබැඳි යකඩ අවියෙහි ගොරහැඩි කමට
මැලවුණ දිවිය පණ ලැබ දලුලයි උඩට
මිල කළ නොහැකි සෙනෙහස දී මගෙ නමට
මල නුඹ පිපුණි හද තුළ සුසිනිඳු සුමට

විනිවිද පපුව සෙනෙහස උඩු දුවා ඇත
ඉණි බැඳ කෙලෙස නවතන්නද බැඳුණු සිත
තනිමග වැලඳගෙන යන්නට නුඹගෙ වත
ගිනි අවියට වඩා මෙලෙකයි සෙබල අත

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ




ස්වේච්ඡා බළසේනා මූලස්ථානය ගොඩනැගෙන නව භූමියෙහි සෙසුනිළයින්ගේ ප්‍රයෝජනය පිණිස ඉදිකළ දෙවන හට නිවාසය ඉකුත් නොවැම්බර් 20 වන දිනට යෙදුණු සුබ මොහොතින් ස්වේච්ඡා බළසේනා සේනාවිධායකගේ සුරතින් විවෘත කෙරිණ. මහල් තුනකින් සැදි සියලු පහසුකම් වලින් සමන්විත එය සෙබලුන්ගේ පරිහරණය සඳහා පරිසර හිතකාමීව නිමවා තිබීම විශේෂත්වයකි. තවද එම භූමියේම ඉදිකිරීමට නියමිත නව නිලධාරි නිවස්නය සඳහාද එදින සේනාවිධායකගේ සුරතින් මුල්ගල තැබිණ.